# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2015

# ඇගයීම් වාර්තාව

# 71- සිංහල

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2015

# ඇගයීම් වාර්තාව

# 71 - සිංහල

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**සිංහල**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2015

## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන් ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන් ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2015 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 210340ක් පාසල් අයදුම්කරුවෝ ද 44851ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) සිංහල විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද සිංහල විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබා ගෙන ඇති ආකාරය සවිස්තරාත්මක ව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2015 විභාගයේ සිංහල විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබා ගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කර ගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීය ව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්යය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයංගම ස්තූතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 ජුනි 29
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එම්.ජී. රත්නපාල<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br><br>ජේ.ඒ.ජේ.ආර් ජයකොඩි<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br><br>එච්. එල්. එස්. අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික) |
| **සැකසුම් කමිටුව** | : | ආර්. කේ. ඒ. එල්. පද්මසිරි<br>ගුරු උපදේශක (ගුරු සේවය I)<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - නක්කාවත්ත<br><br>එච්. වී. එම්. පයාගල<br>ගුරු සේවය I<br>කො/ ගෝතමී බාලිකා විද්‍යාලය<br><br>එම්. ඒ. රණතුංග<br>ගුරු සේවය I<br>සරසවි උයන මහා විද්‍යාලය, පේරාදෙණිය<br><br>ඊ. ධම්මික පරාක්‍රම ද සිල්වා<br>ගුරු සේවය I<br>ක/ විද්‍යාරත්න විද්‍යාලය, හොරණ |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ.ඩී. තිලානි ලක්මාලි<br>රාජ්‍ය කළමනාකරණ සහකාර<br><br>ටී.දර්ශිකා නිලුපුලී<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | වයි. එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරී |

## ඇතුළත පිටු


**I කොටස** පිටු අංකය

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 5
1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 5
1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 6
1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 7
1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 7
1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 10
2.1.2 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු 11
2.1.3 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 28

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 29
2.2.2 II ප්‍රශ්න පත්‍රයේ I කොටස 30
2.2.3 II ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය 32
2.2.4 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 33
2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 34
2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) 36
2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 38
2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 57

**III කොටස**

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 58
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 60

## I කොටස

### 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

#### 1.1 විෂය අභිමතාර්ථ

- ලේඛන ව්‍යවහාරය පාදක කොටගෙන මනා අවබෝධයෙන් යුතුව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
- ලිඛිත ප්‍රකාශන නිරවුල් ව හා අවබෝධයෙන් යුතුව ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
- ලේඛන ව්‍යවහාරය ආශ්‍රිත ව අක්ෂර, පද, වාක්‍ය හා අර්ථ භාවිතය පිළිබඳ පරිචයක් ඇති කිරීම
- කාලීන සමාජ පරිසරයේ පවත්නා වස්තු හා සිදුවීම් පිළිබඳ නිරවුල් අවබෝධය වර්ධනය කිරීම
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ කුසලතා වර්ධනය කිරීම
- විවිධ මානව චර්යා හා ජීවන වෘත්තීන්ට අදාළ ව ප්‍රායෝගිකව භාෂාව භාවිත කිරීමේ කුසලතා වර්ධනය කිරීම
- සංස්කෘතික දායාද, සාම්ප්‍රදායික ආචාර ධර්ම, ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයීම් පිළිබඳ කුසලතා සිංහල භාෂා සාහිත්‍යය පාදක කොටගෙන වර්ධනය කිරීම
- සම්භාව්‍ය හා නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍ය නිර්මාණ පරිශීලනය මගින් ලබා ගත් පරිචය හා අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 53282 | 12795 | 66077 |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 6284 | 11.79 | 1086 | 8.49 | 7370 | 11.15 |
| B | 15217 | 28.56 | 2825 | 22.08 | 18042 | 27.31 |
| C | 19080 | 35.81 | 4433 | 34.65 | 23513 | 35.58 |
| S | 10074 | 18.91 | 3437 | 26.86 | 13511 | 20.45 |
| F | 2627 | 4.93 | 1014 | 7.92 | 3641 | 5.51 |
| එකතුව | **53282** | **100.00** | **12795** | **100.00** | **66077** | **100.00** |

වගුව 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2905 | 213 | 7.33 | 613 | 21.10 | 1067 | 36.73 | 758 | 26.09 | 2651 | 91.26 | 254 | 8.74 |
| 2. ගම්පහ | 3940 | 535 | 13.58 | 1077 | 27.34 | 1339 | 33.98 | 799 | 20.28 | 3750 | 95.18 | 190 | 4.82 |
| 3. කළුතර | 2579 | 310 | 12.02 | 635 | 24.62 | 939 | 36.41 | 533 | 20.67 | 2417 | 93.72 | 162 | 6.28 |
| 4. මහනුවර | 3023 | 248 | 8.20 | 736 | 24.35 | 1133 | 37.48 | 710 | 23.49 | 2827 | 93.52 | 196 | 6.48 |
| 5. මාතලේ | 1133 | 82 | 7.24 | 275 | 24.27 | 470 | 41.48 | 255 | 22.51 | 1082 | 95.50 | 51 | 4.50 |
| 6. නුවරඑළිය | 919 | 82 | 8.92 | 228 | 24.81 | 365 | 39.72 | 211 | 22.96 | 886 | 96.41 | 33 | 3.59 |
| 7. ගාල්ල | 2784 | 376 | 13.51 | 769 | 27.62 | 899 | 32.29 | 537 | 19.29 | 2581 | 92.71 | 203 | 7.29 |
| 8. මාතර | 1994 | 175 | 8.78 | 521 | 26.13 | 691 | 34.65 | 437 | 21.92 | 1824 | 91.47 | 170 | 8.53 |
| 9. හම්බන්තොට | 1423 | 186 | 13.07 | 447 | 31.41 | 488 | 34.29 | 212 | 14.90 | 1333 | 93.68 | 90 | 6.32 |
| 10. යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 11. කිලිනොච්චි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 12. මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 13. වව්නියාව | 68 | 2 | 2.94 | 22 | 32.35 | 35 | 51.47 | 9 | 13.24 | 68 | 100.00 | 0 | 0.00 |
| 14. මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 15. මඩකලපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 16. අම්පාර | 848 | 59 | 6.96 | 193 | 22.76 | 325 | 38.33 | 196 | 23.11 | 773 | 91.16 | 75 | 8.84 |
| 17. ත්‍රිකුණාමලය | 250 | 12 | 4.80 | 52 | 20.80 | 119 | 47.60 | 50 | 20.00 | 233 | 93.20 | 17 | 6.80 |
| 18. කුරුණෑගල | 4145 | 446 | 10.76 | 1044 | 25.19 | 1444 | 34.84 | 971 | 23.43 | 3905 | 94.21 | 240 | 5.79 |
| 19. පුත්තලම | 1508 | 102 | 6.76 | 399 | 26.46 | 611 | 40.52 | 320 | 21.22 | 1432 | 94.96 | 76 | 5.04 |
| 20. අනුරාධපුරය | 1978 | 199 | 10.06 | 544 | 27.50 | 730 | 36.91 | 401 | 20.27 | 1874 | 94.74 | 104 | 5.26 |
| 21. පොළොන්නරුව | 802 | 71 | 8.85 | 151 | 18.83 | 322 | 40.15 | 201 | 25.06 | 745 | 92.89 | 57 | 7.11 |
| 22. බදුල්ල | 2008 | 188 | 9.36 | 515 | 25.65 | 829 | 41.28 | 399 | 19.87 | 1931 | 96.17 | 77 | 3.83 |
| 23. මොනරාගල | 1339 | 140 | 10.46 | 344 | 25.69 | 525 | 39.21 | 261 | 19.49 | 1270 | 94.85 | 69 | 5.15 |
| 24. රත්නපුරය | 2536 | 282 | 11.12 | 706 | 27.84 | 926 | 36.51 | 499 | 19.68 | 2413 | 95.15 | 123 | 4.85 |
| 25. කෑගල්ල | 2263 | 277 | 12.24 | 620 | 27.40 | 775 | 34.25 | 451 | 19.93 | 2123 | 93.81 | 140 | 6.19 |
| **සමස්ත දිවයින** | **38445** | **3985** | **10.37** | **9891** | **25.73** | **14032** | **36.50** | **8210** | **21.36** | **36118** | **93.95** | **2327** | **6.05** |

වගුව 3

1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 0 | 0.00 | 66077 | 100.00 |
| 81 - 90 | 537 | 0.81 | 66077 | 100.00 |
| 71 - 80 | 9041 | 13.68 | 65540 | 99.19 |
| 61 - 70 | 19563 | 29.61 | 56499 | 85.50 |
| 51 - 60 | 18010 | 27.26 | 36936 | 55.90 |
| 41 - 50 | 11536 | 17.46 | 18926 | 28.64 |
| 31 - 40 | 5159 | 7.81 | 7390 | 11.18 |
| 21 - 30 | 1843 | 2.79 | 2231 | 3.38 |
| 11 - 20 | 308 | 0.47 | 388 | 0.59 |
| 01 - 10 | 75 | 0.11 | 80 | 0.12 |
| 00 - 00 | 5 | 0.01 | 5 | 0.01 |

වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (31 - 40 පංති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 5159කි. එය ප්‍රතිශතයක් වශයෙන් 7.81% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 7390 ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 11.18% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි I ප්‍රශ්නය අනිවාර්ය වුව ද එය තෝරා ගෙන ඇත්තේ 99%ක් පමණි. අඩු ම ප්‍රතිශතයක් තෝරා ගෙන ඇත්තේ 4වන ප්‍රශ්නය වන අතර එය තෝරා ගෙන ඇත්තේ 30%ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:-මෙහි1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 40කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 31 - 40 තෙක් ලබා ගත් ප්‍රතිශතය 5%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ, එනම් ලකුණු 00 - 10 තෙක් ලබා ගත් ප්‍රතිශතය 6% කි.

ප්‍රස්තාරය **3** (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


### 1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

මෙහි ඉහළ ම පහසුතාව දක්වා ඇත්තේ (අ) කොටසෙහි (iii) අනුකොටසට ය. එය 93%කි. (අ) කොටසේ (ii) හා (ආ) කොටසේ (i) අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 91%ක් සහ 92%ක් වශයෙන් දැක්විය හැකි ය. අඩු ම පහසුතාව දක්වා ඇත්තේ (ඊ) කොටසෙහි (iii) අනුකොටසට ය. එය 7%කි.

### 1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි පළමුවන ප්‍රශ්නයේ ප්‍රශ්න 20ක් ඇති අතර එක් එක් ප්‍රශ්නයකට දී ඇති වරණ පහ අතුරෙන් නිවැරදි වරණය තේරිය යුතු ය. ලකුණු බැගින් ලකුණු 20ක් හිමි වේ. 1, 2 හා 3 ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන නමුත් එම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ දරා ඇත්තේ පිළිවෙළින් 90%, 93% හා 92%ක් වශයෙනි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:-

මෙහි පළමු වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 9%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 05 තෙක් ලබාගත් ප්‍රතිශතය 7%කි.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 1 කොටසෙහි 1.5 වන කොටසෙහි පහසුතාව 98% වේ. අව ම පහසුතාව ඇත්තේ 1.18 ප්‍රශ්නයට වන අතර එහි අගය 15%කි.




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- II කොටසේ 2 ප්‍රශ්නයෙහි (අ) කොටසේ III අනුකොටසෙහි පහසුතාව 98% වේ. අඩු ම පහසුතාව දක්වන්නේ 5වන ප්‍රශ්නයේ (ආ) කොටසේ (i) අනුකොටසට යි. එය 5%කි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ⋆ කාලය පැය 03කි. මුළු ලකුණු 100කි.
- ⋆ ප්‍රශ්න අටකින් සමන්විත වේ. **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු අතර පිළිතුරු සඳහා වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගත යුතු වේ.
- ⋆ 1 ප්‍රශ්නය කොටස් **හයකින්** සමන්විත වේ. සියලු කොටස්වලට පිළිතුරු සැපයිය යුතු ය. අනෙක් ප්‍රශ්න **හත** අතුරෙන් අභිමත ප්‍රශ්න **හතරක්** තෝරා ගත යුතු වේ.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු

**1 ප්‍රශ්නය**

පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) ඒ කොලු ද ක්‍රියාවෙන් කුම් වුවත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටුදුවණියන් රෙදිකඩෙකින් වසාලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින් එක් ගමෙක රඥාහිඳ අයට අඳයට සී සාගෙන, වප් වපුටගෙන දර පළා ගෙනවුත් ජීවත් වෙති. සිටුදුවණියෝ ද කුසරජු ව උපන් බෝසතුන් ප්‍රභාවතීන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරුණු නියාවට හුදක් පිරිමීහු ම ගෑනුන් නිසා නිකෘෂ්ට ලෙස අවිදිනෝ නොවෙති. ගෑනුත් පිරිමින් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරෙතී යන්න හඟවන්නාක් මෙන් කළයෙන් පැන් ගෙනවුත් තබමින් සිය අතින් ම පරමන් පිසමන් ආදිය කෙරෙමින් තමන් යට කළ අකුශලයෙහි අනිෂ්ටවිපාකය වී බත් කමින් සිට හමු බතකුත් කන්නා සේ අනුභව කරන්ට පටන්ගත්හ.

   (i) සිටුදියණියගේ ස්වරූපය මෙහි ඉදිරිපත් කොට ඇත්තේ කෙබඳු ආකාරයෙන් ද?
   (ii) ජීවත් වීම උදෙසා තරුණයා කවර කාර්යවල නියුතු වූයේ ද?
   (iii) සිටුදියණිය ඉටු කළ ගෘහ කටයුතු මොනවා ද?
   (iv) '**නිකෘෂ්ට**' හා '**අඳයට**' යන වචනවල තේරුම් ලියන්න.

   **පිළිතුරු**

   (i) ක්‍රියාවෙන් කෙසේ වුවත් ජාතියෙන්/කුලයෙන්/වංශයෙන් උසස් අයෙකු වීම
   (ii) කුලියට/මුදලට හා අඳයට කුඹුරු සී සෑම, වී වැපිරීම, දර පැළීම
   (iii) (කළයෙන්) දියගෙන ඒම, වී කෙටීම, ඉවුම් පිහුම් කිරීම
   (iv) නිකෘෂ්ට - පහත්/අධම/නීච
   අඳයට - අස්වැන්නෙන් කොටසක් ලබා ගැනීමට හෝ දීමට යටත් ව ගොවිතැන් කිරීම

   (ලකුණු 04 යි.)

   (ආ) එසඟ රිදී දමක් සේ ධවල වූ සොඬ දිගු කොට විමසන්නා වූ මහ බෝධිසත්ත්වයන්ගේ අත බුද්ධාදීන්ගේ අර්හත් ධ්වජය වූ කාසාය වස්ත්‍රය පුෂ්කරාග්‍රයෙහි වැදි පුත්‍ර තෙම තිබුයේ ය. එබඳු වේදනාවෙන් පීඩිත වූ මහ බෝධිසත්ත්ව තෙම සිතනුයේ 'අර්හත් ධ්වජය නම් සත්කාර ගරුකාර කටයුතුය. එබැවින් මොහු මැරිය යුතු නොවෙයි' සිතා ඒ සෝණුත්තර නම් වැදි පුත්‍රයා සොඬින් ඔසවා ඉදිරියෙහි සිටුවා මෙලෙස කථා කරන්නේය. 'රාගාදී කසටින් කිලුටු ව ඉඳුරන් දැමීමක්, සබවසක් නැති යමෙක් කාෂාය වස්ත්‍රය ධරා වඳුරන් පෙරවි සිංහචර්මයක් මෙන් ඒ ඊට යෝග්‍ය නොවන්නේය.

   (i) ඇතාගේ දිගු කළ සොඬය උපමා කර ඇත්තේ කුමකට ද?
   (ii) මෙහි දැක්වෙන පරිදි චීවරය දැරීමට යෝග්‍ය **නො වන්නේ** කුමනාකාර පුද්ගලයන් ද?
   (iii) 'සබවසක් නැති යමෙක් කාෂාය වස්ත්‍රය ධරා වඳුරන් පෙරවි සිංහචර්මයක් මෙන්' මෙහි උපමාව හා උපමේය පැහැදිලි කරන්න.
   (iv) '**පුෂ්කරාග්‍රයෙහි**' හා '**සබවසක්**' යන වචනවලට අර්ථ සපයන්න.

   **පිළිතුරු**

   (i) රිදී දමකට/රිදී දම්වැලකට/රිදී මාලයකට/රිදී වැලකට
   (ii) රාගය ආදී කෙලෙස්වලින් කිලුටු වූ ඉන්ද්‍රිය දමනයෙන් හෝ සත්‍ය/සභ්‍ය වචනයෙන් තොර පුද්ගලයන්
   (iii) උපමාව - වඳුරන් පොරවා සිටින සිංහ චර්මයක්/සමක් සේ
   උපමේය - සබවසක්/සත්‍ය වචනයක් නැති පුද්ගලයන්ගේ කාෂාය වස්ත්‍ර දැරීම
   (iv) පුෂ්කරාග්‍රයෙහි - සොඬවැල අග
   සබවසක් - සත්‍ය/යහපත්/සත්‍ය වචනයක්

   (ලකුණු 04 යි.)

(ඉ) එම්බා සොඳුර, තොපගේ මොළොක් වූ අතුල් තල නමැති ළඳ පල්ලවයෙන් අලංකෘත ව තෙව්නා මනහර තෙල බාහු යුග්මය ශරීර නමැති කල්පලතායෙන් අටගත් ආශ්චර්යවත් වූ අරළු දෙකක් මෙන් හොබනේ ය. තව ද තොපගේ මඳසිනා නමැති චන්ද්‍රකාන්තීන් යුක්ත වූ මුඛ නමැති චන්ද්‍රතෙම මාගේ සිත් නමැති කෞමුද වනය විශේෂයෙන් ප්‍රබෝධ කරවයි. තව ද තොපගේ අතිරක්ත වූ අධරයුග්මයෙහි රශ්මීන් රැඳුණා වූ දන්තපන්තීහු විලිකුන් දෙළුම්බිජු පෙළක් මෙන් බබළන්නාහ. තව ද අනංගයාගේ මාලිගාදොර නොහොත් රතිමැදිරිදොර රන් යටෙක බඳනා ලද නිල් ධ්වජදෙකක් හා සමාන වූ තොපගේ බැම සඟළ කාමීපුරුෂයන් තමා කරා කැඳවන්නාක් මෙන් විශේෂයෙන් බබළයි.

(i) මෙහි වර්ණිත කාන්තාවගේ බාහු උපමා කොට ඇත්තේ කුමකට ද?

(ii) ඇයගේ දත් විලිකුන් දෙළුම් බීජ පෙළක් මෙන් දිස් වූයේ කවර ආකාරයෙන් ද?

(iii) ඇයගේ දෙබැම විශේෂයෙන් බබළන්නේ කුමන අයුරින් ද?

(iv) '**ළඳ පල්ලවයෙන්**' හා '**තෙව්නා**' යන වචනවල තේරුම් ලියන්න.

**පිළිතුරු**

(i) කල්පලතාවෙන් (සිතූ පැතූ සම්පත් ලබා දෙන වැලෙන්) හටගත් ආශ්චර්යවත් (පුදුම උපදවන සුලු) වූ අරළු (ශාඛාවෙන් පහළට ඇදුණු මුල්) දෙකකට

(ii) ඉතා රතු වූ දෙතොලෙහි රශ්මියෙන් බැබැළීමෙනි

(iii) කාමී පුරුෂයන් තමා කරා කැඳවන්නා සේ

(iv) ළඳ පල්ලවයෙන් - ළා/ළපටි/මොළොක් දලුවලින්
තෙව්නා - බබළන

(ලකුණු 04 යි.)

(ඊ) එ න ස ඳ පෙර මෙ පුර කිරි සිඳු දුව තුටු ව
සි ඳු ර ද විසින් ඇය රැකවරණට කැටු ව
ප රි ස ඳ එවූ සිඳු කඬකෙව් නො ව පටු ව
ඇ ම ස ඳ පිරුණු දිය' ගල ලොබ වෙයි දුටු ව

සු වි ස ල් අගල දිය තුළ පෙනෙන මනහර
ර ළ වු ල් සසල රිවි සඳ මඬල පැහැසර
තු ඟු තු ල් පවුරු හිස පැන යනු බැරි ව හැර
ර ස හ ල් පිවිස හැම වර යනු වැනි මිතුර

(i) සමුද්‍රරාජයා ස්වකීය දියණියගේ ආරක්ෂාව සඳහා එව්වේ කුමක් ද?

(ii) කවියාට අනුව ප්‍රාකාරයෙන් පැනයාමට නොහැකි ව සිටින්නෝ කවුරු ද?

(iii) '**රළවුල් සසල**' යන්නෙන් වෙසෙසා දැක්වෙනුයේ කුමක් ද?

(iv) '**කිරිසිඳු**' හා '**රසහල්**' යන වචනවල තේරුම් ලියන්න.

**පිළිතුරු**

(i) පළල් වූ මුහුදු කඬක්

(ii) හිරු හා සඳු/රිවිසඳ මඬල

(iii) දිය අගල

(iv) කිරිසිඳු - කිරි මුහුද/ක්ෂීර සාගරය
රසහල් - රසාතලය/පාතාල ලෝකය / නාග ලෝකය

(ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "නුඹ මට ජීවිතයක් වැනි බිසවුණි, මේ මිනිස් ලොව ඇති යම් සැපතක් ඇත්නම් එම බොහෝ ව ඇත්තේ ය."

(ii) "වේලා නොවරදවා මෙතෙක් කතර යා හැකි දැ'යි"

(iii) "සත්පුරුෂයන්ට මෛත්‍රී කිරීම සත්පුරුෂයන්ගේ ස්වභාව ධර්මයෙක් ම ය."

(iv) 'දැන් ඔහොම කිවුවට මොකො ද, ඉස්සර නම් ඔහොම නොවේ කතා කළේ"

(v) "මම සතුටු නෑ ඔබතුමාට අප්‍රිය දෙයක් කියන්ඩ"

(vi) "තාත්තා නැති වුණාට පස්සේ මම ගෙදර නැවතුණා."

**පිළිතුරු**

(i) ජාතක කතා පොතේ ඡද්දන්ත ජාතකයෙන් උපුටා ගත් පාඨයකි. රෝගාතුර වෙසක් ගෙන සයනයෙහි වැතිර සිටින සුභද්‍රා බිසව සිය ආශාව ඉටු නොවුණ හොත් මිය යන බව පවසන විට බරණැස් රජතුමා බිසවට මෙසේ පවසයි.

(ii) සද්ධර්මරත්නාවලියේ මච්ඡරියකෝසිය සිටාණන්ගේ කථාවස්තුවෙන් උපුටාගත් පාඨයකි. මුගලන් තෙරුන් වහන්සේ සිටාණන්ගේ මසුරු සිත දමනය කිරීමෙන් අනතුරුව බුදුන් ප්‍රමුඛ සංඝයා වහන්සේලාට කබලු පිළිගන්වන්නට රුවිකත්වයක් දැක්වූ සිටුතුමා තෙරුන් වහන්සේගෙන් මෙසේ අසයි.

(iii) සද්ධර්මාලංකාරයේ ආරඤ්ඤක අභය ස්ථවිර කථාවස්තුවෙන් උපුටාගත් පාඨයකි. උපාසකගෙන් දඬුවම් ලැබූ හරන්තිකට තෙරුන්වහන්සේ උවටැන් කරමින් සිටිද්දී එතැනට පැමිණ එයට විරෝධය දක්වන උපාසකට තෙරුන් වහන්සේ මෙසේ පවසති.

(iv) මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටාගත් පාඨයකි. දෙවෙන්දොරා සං සිය රටට පැමිණීමට ආසන්න දිනයක අනාගතය පිළිබඳ නොරිකෝ සමග කළ කතාබහක දී නොරිකෝ ඔහුට මෙසේ පවසයි.

(v) රත්නාවලී නාට්‍යයෙන් උපුටා ගත් පාඨයකි. වාසවදත්තා බිසව විසින් නිදහස් කරනු ලැබූ විදූෂක උදයන රජු හමුවීමට පැමිණි විට රජතුමා ඔහුගෙන් සාගරිකා පිළිබඳ තොරතුරු අසයි. එවිට විදූෂක රජුට මෙසේ පවසයි.

(vi) ප්‍රදීපාගාරය යට කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. කථකයා කුඩා සමන්තිකාගෙන් පාසල් නො යන්නේ කුමක් නිසා දැ'යි අසන විට ඇය ඔහුට මෙසේ පිළිතුරු දෙයි.

(ලකුණු 08 යි.)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

ඔබා දෙදණ නිල් උඩුපියළි බිම මත
වැන්දේ ය ඔහු බැති සිතින්
අම්මා වැළලූ තැන මහ පොළොවට;
පිපිලා තිබුණි එතැන සුදු පාටට
නමක් නොමැති පුංචි මලක්
සිම්බේ ය ඔහු එමල නමා හිස

දස මසක් කුස තුළෙහි දරා සිට
මා ලොවට වැදූ අම්මා ඔබ ය.
කෙළවරක් නොමැති දුක් දරා විඳ
මා ලොවට හැදූ අම්මා ඔබ ය

අඬන විට මා කුඩා අවධියෙහි බඩගිනි ව
තම්බා බතල දළු
ලුණු දියර ඉස
පොල් ගා මුසු කොට කවා
බඩගිනි නිවූ අම්මා ඔබ ය

උයා උදයෙන් නැගිට කඩයප්පන්
තබා තේ කඩයෙහි
ලබා ඉන් ලැබෙන සුළු වට්ටම
ජංගි ඇන්දූ අම්මා ඔබ ය

ගල්වා ඉසෙහි තෙල් යහමින්
එල්ලා කරෙහි පංචායුදය
අල්ලා ගෙන අතින් මා
පාසලට එක්ක ගිය
අකුරු නූගත් අම්මා ඔබ ය

ඇවිද ලඳු දෙණි කැලෑ බිම්වල
රැගෙන විත් තුන්හිරිය පත් කොළ
යොදා කුකුල් සායම් රතු හා කොළ
වියා නෙක් විසිතුරු රටා පැදුරු
රටාවක් බව මේ මහා විශ්වය
කුඩා කල සිට ම මට
කියා දුන් අම්මා ඔබ ය

නොදත්තෙමි මම එකල
අම්මේ, ඔබ වත කැටපතක් බව;
මෙකල මා සිත පිළිබිඹු කරන
ගිලී යට ගිය ඇස් කුහර තුළ
නොදුටුවෙමි කිසිවිටක සතුටක්
නොදුටුවෙමි කිසිවිටක දුකකුත්

ඉවසා සම සිතින් සැම සැප දුක්
ලැබුවා ද ඔබ සිතෙහි සාමයක්?
ඉපයුවෙමි මම මුදල්
ඉපයුවෙමි කිතු යසස්
වී ය මන්දිර යාන වාහන,
එහෙත් ඒ කිසිවකිනුත්
නොලදිමි සිත් සැනසුමක්
වටහාගෙන සිටියා ද ඔබ ඒ සත්‍යය
නොලබා ම ඔබ ඒ කිසිවක්?


**රසාස්වාදය**

මවකගේ උතුම් ගුණ සමුදාය පිළිබඳ ව පුතෙකුගේ මතක ආවර්ජනය වස්තු විෂය කරගත් පද්‍ය පන්තියකි. දරුවාට ආදරය කරමින් ඔහුගේ පෝෂණය, රැකවරණය හා අධ්‍යාපනය සඳහා මව විසින් කරනු ලබන කැප කිරීම් මෙන් ම ඇය යෙදෙන ජීවන අරගලයත්, දුක සැප ආදී ජීවිත ස්වභාවයන් මැදහත් සිතින් විඳ දරා ගැනීමට ඇයට තිබූ හැකියාවත්, මව ඇසුරෙන් විඳි ලෝකයේ සෞන්දර්යයත් කථකයාගේ ආවර්ජනය ඇසුරෙන් ඉදිරිපත් කෙරේ. කලකට පසුව මවගේ සොහොන අබියසට පැමිණෙන කථකයා ජීවිත යථාර්ථය පසක් කර, මවගේ දිවි පැවැත්ම අගය කරමින් තම ජීවන චර්යාවන්හි නිස්සාරභාවය අවබෝධ කරගනී.

කාව්‍ය රසාස්වාදයට යෝග්‍ය වන සංකේත, ව්‍යංග්‍යාර්ථ, සංකල්ප රූප, ශබ්දාලංකාර හා අත්දැකීමට උචිත ආකෘතියක් ද යොදා ගනිමින් පද්‍ය පන්තිය නිර්මාණය කර ඇති ආකාරය අවධානයට යොමු විය යුතු ය.

(ලකුණු 16 යි.)


**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 10 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 46%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 5%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 30ට වඩා ලබා ගත් පිරිස 5%ක් වන අතර 49%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 21ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් 6ක් ද, අනුකොටස් 23ක් ද ඇති අතර පහසුතාව 40%ට වඩා වැඩි අනුකොටස් 12ක් ඇත. 20%ට වඩා අඩු පහසුතාව ඇති අනුකොටස් 4ක් ඇත.

මෙම පත්‍රයේ පළමුවන ප්‍රශ්නය කොටස් හයකින් සමන්විත වේ. මේ යටතේ අර්ථාවබෝධය සඳහා (අ), (ආ), (ඉ), (ඊ) කොටස් හතර ද, අවස්ථා සම්බන්ධය සඳහා (උ) කොටස ද, රසාස්වාදය සඳහා (ඌ) කොටස ද වෙන් කෙරේ.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අර්ථාවබෝධය)**

අර්ථාවබෝධය සඳහා ඇති කොටස් හතරෙහි සෑම කොටසක් ම අනුකොටස් හතරකින් යුක්ත වේ. ඒවා නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගෙන ඇත. මෙම කොටස් සඳහා පිළිතුරු සැපයීමේ දී තෝරා ගත් පදවලට ලිහිල් බසින් අරුත් දැක්වීමත්, සංකීර්ණත්වයෙන් යුතු වාක්‍ය තුළින් යෝග්‍ය පිළිතුරු තෝරා ගැනීමත් කෙරෙහි අපේක්ෂකයන්ගේ ඉහළ පහසුතා මට්ටම විද්‍යමාන නො වේ. එහෙත් නිර්දිෂ්ට ඡේදය ආශ්‍රිත ව ඍජුව ම අසා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු සතුටුදායක ය.

පහත දැක්වෙන කොටස්වල පිළිතුරු විමසා බැලීමේ දී මේ තත්ත්වය පැහැදිලි වේ. මෙහි සෑම කොටසක ම දී ඇති පදවලට පරිකථා ලිවීම සාර්ථක වී නැත. නිදසුන් වශයෙන් (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වල (iv) වන අනුකොටස් සඳහා දී ඇති පිළිතුරු දැක්විය හැකි ය.

සංකීර්ණ වාක්‍ය අතුරෙන් යෝග්‍ය පිළිතුරු තෝරා ගැනීමේ දී අපේක්ෂකයන් මුහුණ පෑ දුෂ්කරතාව (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වල පිළිවෙළින් (අ) හි (i), (ආ) හි (iii), (ඉ) හි (iii), (ඊ) හි (i), (ii), (iii) යන අනුකොටස් යටතේ සපයා ඇති පිළිතුරුවලින් පැහැදිලි වේ.

**නිගමන හා යෝජනා**

මේ අනුව සම්භාව්‍ය සාහිත්‍යයේ වචනවල අරුත් පැහැදිලි ව හා නිරවුල් ව තේරුම් ගැනීමටත්, සංකීර්ණ වාක්‍යයක ගැබ් වූ අදහස් උකහා ගැනීමටත් අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු ය.

දන්නා දෙය පාදක කර ගෙන නොදන්නා තොරතුරු වටහා ගැනීමේ ශක්තිය හා පුරුද්ද අපේක්ෂකයන් තුළ ඇති කළ යුතු ය.

ගද්‍ය පද්‍ය පාඨවල සමස්ත අර්ථය පැහැදිලි කිරීමේ දී ව්‍යක්ත සිංහල රීතිවලට අනුකූල විය යුතු ය.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අවස්ථා සම්බන්ධය)**

(උ) කොටස යටතේ ඇති උද්ධෘත පාඨවල අවස්ථා සම්බන්ධය දැක්වීමේ දී පිළිවෙළින් (iii), (ii), (i) අනුකොටස්වල සතුටුදායක සාධන මට්ටමක් දක්නට ඇතත් (iv), (v), (vi) අනුකොටස්වල පහසුතා මට්ටම අඩු වී ඇති බව පෙන්නුම් කෙරෙයි.

මෙහි (i), (ii), (iii) කොටස් පැරණි සාහිත්‍යයෙන් ද, (iv), (v), (vi) කොටස් නූතන සාහිත්‍යයෙන් ද උපුටා ගෙන ඇත. පැරණි සාහිත්‍යයෙන් විෂය නිර්දේශයට ඇතුළත් කර ඇත්තේ සීමිත කතා කිහිපයක් පමණි. එහෙත් නූතන සාහිත්‍යය යටතේ නවකතාවක් ද, නාට්‍යයක් ද, කෙටි කතා 12ක් ද ඇතුළත් වේ. නූතන සාහිත්‍ය කෘති කියවීමේ දී අපේක්ෂකයන් වැඩි අවධානයක් යොමු කර ඇත්තේ කතාවල අවස්ථා සම්බන්ධයට වඩා අන්තර්ගත කරුණු මෙන් ම කතා වස්තුව ද කෙරෙහි බව පෙනේ. මේ අනුව පැරණි සාහිත්‍යයේ සීමිත කතා කිහිපයක අවස්ථා සම්බන්ධය මතක තබා ගැනීමට පහසු වී ඇති බවත්, නූතන සාහිත්‍යයේ අවස්ථා සම්බන්ධය මතක තබා ගැනීමට දුෂ්කර වී ඇති බවත් පිළිතුරු තුළින් නිරීක්ෂණය විය.

**නිගමන හා යෝජනා**

පැරණි සහ නූතන ග්‍රන්ථ කියවීමේ දී වැදගත් අවස්ථා මොනවා දැ යි හඳුනා ගැනීමත්, ඒවායේ සම්බන්ධය පැහැදිලි ව තේරුම් ගැනීමත් අවශ්‍ය වේ. මෙහි දී ග්‍රන්ථ කර්තෘ හා කෘතියේ නම පමණක් නො ව, කවුරුන් විසින්, කෙබඳු අවස්ථාවක දී, කුමක් අරබයා, කවුරුන්හට ප්‍රකාශ කරන ලද්දක් ද? යන්න ගැනත් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. අවස්ථා සම්බන්ධය පිළිබඳ ව නූතන ග්‍රන්ථ පරිශීලනයේ දී වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (රසාස්වාදය)**

(ඌ) කොටස යටතේ රසාස්වාදය සඳහා දී ඇති කවි පෙළ පිළිබඳ ව අපේක්ෂකයන්ගේ පහසුතා මට්ටමෙහි සතුටුදායක තත්ත්වයක් දක්නට ඇත. මෙම කවි පෙළ නූතන සාහිත්‍යයෙන් ගෙන ඇති නිර්දිෂ්ට කවි පෙළක් නිසාත්, අර්ථය සුගම වූ නිසාත් අපේක්ෂකයන්ට රසාස්වාදය කිරීම පහසු වූවා සේ පෙනේ. රසාස්වාදය පිළිබඳ මූලික දැනුම පාදක කොටගෙන කවර කවි පෙළක් පිළිබඳ ව වුව ද රසාස්වාදයක යෙදීමට අපේක්ෂකයන්ට හැකියාවක් තිබිය යුතු ය.

රසාස්වාදය පිළිබඳ පහසුතා මට්ටම අතින් දුර්වල ස්වභාවයක් පෙන්වූ අපේක්ෂකයන් පිළිබඳව ද මෙහි දී සලකා බැලිය යුතු වේ. ඔවුන් තුළ රසාස්වාදයට අදාළ මූලික කරුණු පිළිබඳ නිරවුල් අවබෝධයක් නො තිබුණු බව පිළිතුරු තුළින් දක්නට ලැබෙන අතර ඊට අනුරූප ව පහසුතා මට්ටම අඩු වී ඇති බව ද නිරීක්ෂණය කළ හැකි ය.

**නිගමන හා යෝජනා**

කාව්‍ය රසාස්වාදයේ දී රසාස්වාද මූලධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් මෙන් ම පරිචයක් ද කාව්‍යෝක්ති පිළිබඳ දැනුමක් ද අපේක්ෂකයන්ට ලබා දීම වැදගත් වේ. මෙහි දී කාව්‍ය නිර්මාණයේ අන්තර්ගතය හා ආකෘතිය යන අංශ දෙක ගැන ම අවධානය යොමු විය යුතු ය. අන්තර්ගතය යටතේ වර්ණනය උදෙසා කවියා තෝරා ගත් කරුණු ද, ආකෘතිය යටතේ කවියා යොදා ගෙන ඇති භාෂාව හා වෙනත් ශිල්පීය උපක්‍රම ගැන ද අවධානය යොමු විය යුතු ය. රසාස්වාදය යනු හුදෙක් නිර්දිෂ්ට කවි පෙළ ගැන කෙරෙන විස්තරයක් නො වන බව ද අපේක්ෂකයන් අවබෝධ කර ගත යුතු ය.

**2 ප්‍රශ්නය**

**2.** "සද්ධර්මරත්නාවලිය උසස් සාහිත්‍ය කෘතියක් බවට පත්වීමට හේතු වූයේ මානව චර්යාවන් සම්බන්ධයෙන් කතුවරයා ප්‍රකට කරන ජීවන දෘෂ්ටියයි." නියමිත කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

"ජාතක පොත සහෘදයාගේ සම්භාවනාවට පාත්‍ර වූ කෘතියක් බවට පත් වන්නේ පොදු මිනිස් අත්දැකීම් විවරණයෙහි ලා කතුවරයා විදහා දක්වන සියුම් නිරීක්ෂණ ශක්තිය හේතුවෙනි." නියමිත කතා **දෙකක්** ඇසුරෙන් උක්ත කියමන පිරික්සන්න.

**පිළිතුරු**

පටාචාරා කථා වස්තුවේ සිටු දියණිය හා ඇයගේ සැමියා (දාසයා) හැසිරෙන ආකාරය හා ඔවුන්ගේ ජීවන අත්දැකීම් ද මච්ඡරියකෝසිය කථා වස්තුවේ සිටාණන් හා ඔහුගේ ඇඹේණියගේ ක්‍රියා කලාප ද ඇසුරෙන් කතුවරයාගේ සානුකම්පිත වූත් ඇතැම් විට උපහාසාත්මක වූත් ජීවන දෘෂ්ටිය පිළිබිඹු කෙරෙන ආකාරය නිදසුන් මගින් පෙන්වා දී තිබිය යුතු ය.

පටාචාරා කථා වස්තුවේ සිටු දියණිය මිථ්‍යාචාරයෙන් වළක්වා ගැනීමට මතු මහල් තලයේ ශ්‍රීයහන් ගබඩාවක රඳවා තැබීම, මෙහෙකරුවකු සමග මිත්‍රත්වයක් ඇති කර ගෙන රහසේ පලා යාම, අසරණ ලෙස දරුවන් බිහි කිරීමට සිදු වීම, සියලු ඥාතීන් අහිමි වීම, උන්මත්තකභාවයට පත් වීම වැනි කරුණු හා මච්ඡරියකෝසිය කථා වස්තුවේ සිටාණන් කබලු කෑමේ ආශාව සඟවා ගෙන සිටීමෙන් දුකට පත්වීම, සිටු දියණිය ඇඩි වෑයමකින් එය අනාවරණය කර ගැනීම, කබලු පිසීමට සූදානම් වීම, මුගලන් තෙරුන් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය හා බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට කබලු පිළිගැන්වීමට පෙලඹීම වැනි කරුණු ඇසුරෙන් පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.


(ලකුණු 15 යි.)

නැතහොත්


මිනිසාට පොදු වූ අත්දැකීම් විවරණය කිරීමේ දී ඡද්දන්ත ජාතකයේ චුල්ල සුභද්‍රා ඇතින්න, ඡද්දන්ත හස්ති රාජයා, සුභද්‍රා බිසව, බරණැස් රජතුමා, සෝණුත්තර වැදි පුත්‍රයා ආදීන් ද ගණ්ඩතින්දු ජාතකයේ පංචාල රජතුමා, රජුගේ සේවකයන් හා සාමාන්‍ය ජනතාව ආදීන් ද සම්බුලා ජාතකයේ සොත්ථිසේන රජතුමා හා සම්බුලා බිසව යන චරිත ද දේවධර්ම ජාතකයේ රජතුමා හා බිසව, මහිංසාස කුමාරයා ආදීන් ද සිතන, පතන හා හැසිරෙන ආකාරය පිළිබඳ ජාතක කතා කතුවරයා නිරීක්ෂණය කරන්නේ කෙසේ දැ'යි විමසා බැලිය යුතු අතර, ඉහත ජාතක කතාවලින් දෙකක් පිළිබඳ ව අවධානය යොමු කරමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය වේ.

(ලකුණු 15 යි.)

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 89%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 57%ක් ද,
ලකුණු 12 -15 ප්‍රාන්තරයේ 18%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 18%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 25%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. ඉන් පළමුවන විකල්පයෙහි පහසුතාව 61%ක් වන අතර දෙවන විකල්පයෙහි පහසුතාව 42%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නය සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයට අයත් සද්ධර්මරත්නාවලියෙන් හා ජාතක කතා පොතෙන් සකස් වී ඇත. මෙහි පළමුවන විකල්පයෙහි මානව චර්යා සම්බන්ධයෙන් කතුවරයා පිළිබිඹු කරන ජීවන දෘෂ්ටියත්, දෙවන විකල්පයෙන් පොදු මිනිස් අත්දැකීම් විවරණයෙහි ලා කතුවරයා විදහා දක්වන සියුම් නිරීක්ෂණ ශක්තියත් පිළිබඳ ව විමසා බැලෙයි. එකිනෙකට ළංවන තේමා දෙකක් යටතේ මෙම ප්‍රශ්නයෙහි විකල්ප කොටස් සකස් වී ඇත. අපේක්ෂකයන්ගේ පහසුතාව වඩාත් හොඳින් නිරූපණය වන්නේ පළමුවන විකල්පයෙහි වන අතර දෙවන විකල්පයෙහි පෙනෙන්නේ අඩු පහසුතාවකි.

**නිගමන හා යෝජනා**

සද්ධර්මරත්නාවලියෙහි නිර්දිෂ්ට වූ කතා ඇත්තේ දෙකකි. එහෙත් පන්සිය පනස් ජාතක කතා පොතෙන් කතා හතරක් නිර්දිෂ්ට වී ඇත. කතා හතරක් කියවා තේරුම් ගැනීමත්, ඉන් කතා දෙකක් ඇසුරෙන් පිළිතුරු ලිවීමත් මගින් පෙනී යන්නේ පහසුතාව අතින් අපේක්ෂකයන්ට ගැටලු මතු වී ඇති බවයි. එහෙත් සද්ධර්මරත්නාවලියේ කතා දෙකක් පමණක් නිර්දිෂ්ට ව ඇති නිසා එමගින් සිසුන්ට වැඩි පහසුතාවක් ඇති විය.

විමර්ශනය පාදක කොටගත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ප්‍රස්තුත කතා වස්තුව ආරම්භයේ සිට අවසානය දක්වා විස්තර කිරීම කෙරෙහි පමණක් ඇතැම් අපේක්ෂකයන්ගේ අවධානය යොමු වී ඇත. එයින් පැහැදිලි වන්නේ කිසියම් කෘතියක් කෙරෙහි විමර්ශනාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමට හැකියාව ඔවුන් තුළ ඉහළ මට්ටමකින් නො පවතින බවයි. සද්ධර්මරත්නාවලිය හා ජාතක කතා පොත ආශ්‍රයෙන් මතු කර ගත හැකි විචාරාත්මක කරුණු පාදක කර ගෙන රචිත ලිපි ලේඛන කෙරෙහි වැඩි අවධානයක් අපේක්ෂකයන් තුළ ඇති කිරීම මෙහි දී ප්‍රයෝජනවත් වේ.

**3 ප්‍රශ්නය**


3. පුද්ගල ජීවිතවල පවත්නා හොඳ පැත්ත මෙන් ම නරක පැත්ත ද සියුම් ලෙස විවරණය කිරීම සඳහා සද්ධර්මාලංකාර කතුවරයා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇත් දැ'යි නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.

**පිළිතුරු**


පුද්ගලයන් තුළ පවත්නා ශ්‍රද්ධාව, පරිත්‍යාගශීලීත්වය, සමානාත්මතාව, යහගුණ ඇගයීම, මෛත්‍රී සහගතභාවය, වැරදි අවබෝධ කර ගැනීම හා නිවැරදි මාර්ගයට ප්‍රවේශ වීම වැනි යහපත් ගති ලක්ෂණ ද අන්සතු දෑ පැහැර ගැනීමේ චේතනාව, අකරුණාවන්ත භාවය, අවමන් කිරීමේ මානසිකත්වය හා කෝපයට පත්වීම වැනි අයහපත් ගති ලක්ෂණ ද නිර්දිෂ්ට කතා ඇසුරෙන් විවරණය වී ඇති ආකාරය ගැන අවධානය යොමු කර තිබීම අවශ්‍ය වේ.

(ලකුණු 15 යි.)

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 70%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 55%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 21%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 21%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 24%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 60%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නය සද්ධර්මාලංකාරය ආශ්‍රයෙන් සකස් වී ඇත. මෙහි දී පුද්ගල ජීවිතයේ හොඳ හා නරක පැති සියුම් ලෙස විවරණය කිරීම පාදක කොටගෙන අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කෙරේ. මෙහි පහසුතාව සැලකීමේ දී පෙනී යන්නේ මධ්‍යස්ථ පහසුතා මට්ටමකි. නිර්දිෂ්ට කතා වස්තු දෙක කෙරෙහි ම සමබර දෘෂ්ටි කෝණයකින් නො බැලීමත්, චරිත නිරූපණය හා අවස්ථා සම්බන්ධය ගැන අවධානය යොමු නො කිරීමත් නිසා ඇතැම් පිළිතුරු අසාර්ථක වූ බව පෙනේ.

**නිගමන හා යෝජනා**

සද්ධර්මාලංකාරයෙහි ප්‍රස්තුත ප්‍රශ්නයට අදාළ ව මෙන් ම වෙනත් කරුණු ආශ්‍රයෙන් ද රචිත ලිපි ලේඛන කියවා තම විචාර ශක්තිය දියුණු කර ගැනීම කෙරෙහිත්, කතා වස්තු විස්තර වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා මධ්‍යස්ථ ව හා විමර්ශනාත්මක ව ඒවා ගැන සලකා බැලීමටත් අපේක්ෂකයන් යොමු කරවීම මෙහි දී වැදගත් වේ.

**4 ප්‍රශ්නය**

4. "සාම්ප්‍රදායික කාව්‍යාලංකාරවලින් පෝෂිත වූ බස්වහරක් භාවිත කළත්, නිර්ව්‍යාජ අත්දැකීම් ඇසුරෙන් සජීවී ලෙස රමණීය වර්ණනා ඉදිරිපත් කිරීම නිසා ගිරාසන්දේශය පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී." වර්ණනා **දෙකක්** ඇසුරෙන් විභාග කරන්න.


**පිළිතුරු**

සාම්ප්‍රදායික කාව්‍යාලංකාර ලෙස සැලකිය හැකි උපමා, රූපක, උත්ප්‍රේක්ෂා, ශ්ලේෂ, අතිශයෝක්ති, ස්වභාවෝක්ති ආදී අර්ථාලංකාර මෙන් ම විරිත්, එළිසම, අනුප්‍රාස වැනි ශබ්දාලංකාර ද ගිරාසංදේශ කාව්‍ය රචකයා සුලබ ලෙස යොදා ගනී. මෙම කරුණු පුර වැනුම, රජ වැනුම, රජ සබ වැනුම, විජයබා පිරිවෙන්පති වැනුම වැනි වර්ණනා ආශ්‍රයෙන් ද නිර්ව්‍යාජ අත්දැකීම් පදනම් කර ගනිමින් රමණීය වර්ණනා ඉදිරිපත් කිරීම, දියකෙළි වැනුම, වන වැනුම, තොටගමු වෙහෙර වැනුම සහ මග වැනුමේ ඇතැම් අවස්ථා හා පුද්ගල, වස්තු වර්ණනා, ආශ්‍රයෙන් ද පැහැදිලි කර තිබීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.


ඉහත දැක් වූ ඕනෑම වැනුම් දෙකක් ආශ්‍රයෙන් වුව ද උක්ත කරුණු උදාහරණ මගින් පැහැදිලි කර තිබේ නම් සාර්ථක පිළිතුරක් ලෙස පිළිගත හැකි ය.

(ලකුණු 15 යි.)

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 30%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 22%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 22%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 26%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 58%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

4වන ප්‍රශ්නයේ පහසුතාව 58%කි. ගිරා සංදේශය ආශ්‍රයෙන් සකස් වී ඇති මෙම ප්‍රශ්නය මගින් නිර්ව්‍යාජ අත්දැකීම් ඇසුරෙන් සජීවී ලෙස රමණීය වර්ණනා ඉදිරිපත් කිරීම පිළිබඳ ව විමසා බැලේ. එසේ ම සාම්ප්‍රදායික කාව්‍යාලංකාරවලින් පෝෂිත බස්වහරක් යෙදීම එම රමණීය වර්ණනාවලට බාධාවක් නො වන බව ද ප්‍රශ්නයෙන් ගම්‍යමාන වේ. මේ අනුව රමණීය වර්ණනා පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන අතර ම මේ සඳහා සාම්ප්‍රදායික භාෂා ව්‍යවහාරය බාධාවක් නො වූ බව ද අපේක්ෂකයන් පැහැදිලි කළ යුතු ය. මෙහි දී අංශ දෙකක් ආශ්‍රිත ව ප්‍රශ්නය යොමු කිරීම නිසා ඇතැම් විට අපේක්ෂකයන්ගේ පහසුතා මට්ටම අඩු වූවා විය හැකි ය. බොහෝ අපේක්ෂකයන්ගේ පිළිතුරුවලින් විද්‍යමාන වූයේ වර්ණනාවල රමණීයත්වය හුවා දැක්වීම පමණි. ඒවායේ උසස් බවට හේතු වූ භාෂා අලංකාරෝක්ති භාවිතය ගැන අවධානය යොමු වී තිබුණු බවක් නො පෙනිණි.

**නිගමන හා යෝජනා**

ගිරා සංදේශය ආශ්‍රයෙන් එහි සාම්ප්‍රදායික කාව්‍යාලංකාර භාවිතය, කවියාගේ අත්දැකීම් සජීවී ලෙස රමණීය ආකාරයෙන් ඉදිරිපත් කිරීම හා රසාස්වාදය ආදී කරුණු විමර්ශනය කෙරෙන ලිපි ලේඛන කෙරෙහි අපේක්ෂකයන් යොමු කිරීම මෙහි දී ප්‍රයෝජනවත් වේ.

**5 ප්‍රශ්නය**

5. "එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'මළගිය ඇත්තෝ' නවකතාවෙන් නිරූපණය වන්නේ ස්ත්‍රී-පුරුෂ ප්‍රේමයේ ආකූලත්වය හා ගුප්ත ස්වරූපයයි." විමර්ශනය කරන්න.


**පිළිතුරු**

මළගිය ඇත්තෝ නවකතාවේ ප්‍රධාන චරිත වන දෙවෙන්දොරා හා නොරිකෝගේ චරිත ඇසුරෙන් පැන නගින පහත දැක්වෙන කරුණු පිළිතුරු ලිවීම සඳහා යොදා ගත හැකි ය.


- දෙවෙන්දොරා නොරිකෝට ප්‍රේම කළ ද විවාහාපේක්ෂාවක් නොමැති වීම
- දෙවෙන්දොරා, ඕකතා සං වැනි බාහිර පුද්ගලයන් මාර්ගයෙන් තම සිතේ නොරිකෝට ඇති ආදරය උරගා බැලීමට තැත් කිරීම
- නොරිකෝ වෙනුවෙන් පරිත්‍යාගශීලී පෙම්වතෙකු වීමට සිතුව ද ඔහු ඊට පටහැනි ආකාරයෙන් ක්‍රියා කිරීම
- වෙනත් පුද්ගලයෙකු හා විවාහ වීමට නොරිකෝට ව්‍යාජ අනුබලයක් ලබා දීම
- නොරිකෝ ලංකාවට කැඳවා ගෙන ඒමට නිශ්චිත පියවරක් නො ගැනීම හා ඇයගෙන් දූරස්ථවීමේ කාන්සියෙන් පෙළීම
- නොරිකෝ ලංකාවට පැමිණීම පිළිබඳ ව අපේක්ෂා සහගත ව කතා කිරීම හා නකජිමා සොහොනට ඇතුළු වීමට කැමැත්තක් දැක්වීම
- නොරිකෝ ද අනාගතය පිළිබඳ අස්ථාවරත්වයක පසුවීම

(ලකුණු 15 යි.)

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 49%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 11%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 11%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 39%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

ස්ත්‍රී පුරුෂ ප්‍රේමයේ ආකූලත්වය හා ගුප්ත ස්වරූපය මළගිය ඇත්තෝ නවකතාවෙන් විමසා බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණයි. මෙම නවකතාවෙහි නිරූපිත චරිත අනුව ස්ත්‍රී පුරුෂ ප්‍රේමය ආකූල වූවක් මෙන් ම ගුප්ත ස්වරූපයෙන් යුක්ත වූවක් බව ද නිදසුන් ඇසුරෙන් අපේක්ෂකයන් පැහැදිලි කළ යුතු ව තිබිණි. අංශ දෙකක් ඇසුරෙන් මෙහි දී පිළිතුරු ලිවිය යුතු වීම නිසා යෝග්‍ය නිදසුන් සපයා ගැනීමට ඇතැම් අපේක්ෂකයන් අපොහොසත් වූ බව පෙනේ.

**නිගමන හා යෝජනා**

මළගිය ඇත්තෝ නවකතාවේ අන්තර්ගතය මගින් හෙළි වන ස්ත්‍රී පුරුෂ ප්‍රේමය මෙන් ම වෙනත් කරුණු කෙරෙහි ද, ගුරුවරුන් අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවීම අවශ්‍ය වේ. පහසුතාව අඩු වීම කෙරෙහි ඇතැම් විට ප්‍රශ්නයෙන් අවධාරණය කෙරෙන ගුප්ත ස්වරූපය හා ආකූලත්වය වැනි යෙදුම් අපේක්ෂකයන් අවබෝධ කොට නො ගැනීම හේතු වූවා විය හැකි ය. අපේක්ෂකයන් ඉදිරිපත් කර ඇති බොහෝ නිදසුන්වලින් මෙම තත්ත්වය පැහැදිලි වේ.

**6 ප්‍රශ්නය**

**6.** "අවිවේකී ජීවන රටාවත්, ආරෝපිත පුහු මානයත් හේතුවෙන් දුරස්ථ වී ගිය මානව සම්බන්ධතා මැනවින් නිරූපණය කෙරෙන කෙටිකතාවක් ලෙස ජයතිලක කම්මැල්ලවීරගේ 'තාත්තාගේ මළගම' අගය කළ හැකි ය." විමසන්න.

**පිළිතුරු**


'තාත්තාගේ මළගම' කෙටිකතාවේ කථකයා හා ඔහුගේ බිරිඳ රැකියාවල යෙදෙන්නවුන් වීම හේතුවෙන් අවිවේකී ජීවිත ගත කරති. සති අන්තයේ නිවාඩු දින දෙක තුළ ඔවුන්ට ඉටු කර ගත යුතු කාර්යයන් බොහෝ ය. එබැවින්, ගමේ සිටිනා පියා හෝ සොහොයුරන් දැක ගැනීමට ඔවුනට අවකාශයක් නො ලැබේ.

එසේ ම පියා ගැමියකු වීම නිසා අගනුවර වෙසෙන පුතා (කථකයා) සිය පුහු ආටෝපය රැකගැනීමේ අටියෙන් පියා සිය නිවසට කැඳවා ගෙන නො එයි. ඔහු ණයට ගත් මුදල් පියාගේ අවමගුල් උත්සවයේ දී වියදම් කරන්නේ හුදෙක් මියගිය පියා වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට වඩා ජීවත්වන තමාගේ තත්ත්වය ආරක්ෂා කර ගැනීමට ය.


මෙම කරුණු නිදසුන් සහිත ව පෙන්වා දීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

(ලකුණු 15 යි.)

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 40%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 13%ක් ද
ලෙසින් ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 13%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 37%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 52%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

6වන ප්‍රශ්නයේ පහසුතාව 52%ක් වේ. තාත්තාගේ මළගම කෙටිකතාව ආශ්‍රයෙන් මානව සම්බන්ධතා දුරස්ථ වී යාමත්, ඒ සඳහා අවිවේකී ජීවන රටාව හා ආරෝපිත පුහුමානය හේතු වී ඇති ආකාරයත් පිළිබඳ ව විමසා බැලේ. මෙය තරමක් සංකීර්ණ ප්‍රශ්නයකි. මානව සම්බන්ධතා දුරස්ථ වීමට හේතු වූ කරුණු දෙකක් වන අවිවේකී ජීවන රටාවත්, ආරෝපිත පුහු මානයත් පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. පිළිතුරුවලින් පෙනී ගියේ ඇතැම් අපේක්ෂකයන්ට කෙටි කතාව විස්තර කිරීමට හැකියාව ඇතත් අදාළ ප්‍රශ්නවලට යෝග්‍ය ආකාරයෙන් නිදසුන් සහිත ව පිළිතුරු සැපයීමට හැකියාවක් නොමැති වූ බවයි.

**නිගමන හා යෝජනා**

මෙබඳු ප්‍රශ්නවලට අදාළ කරුණු කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු කිරීම මැනවි. නිර්දිෂ්ට කෙටිකතා තුළින් පිළිබිඹු වන චරිත, සමාජ ස්වරූපය, මානව චර්යා ආදී කරුණු මතු කරමින් ඒවායේ වැදගත්කම ශිෂ්‍යයන්ට පැහැදිලි කර දීම අත්‍යවශ්‍ය කරුණක් වේ. එසේ ම කෙටිකතා විචාරය ආශ්‍රිත ව ලියැවුණු පොත පත කියවීමටත් ශිෂ්‍යයන් යොමු කරවීම වැදගත් වේ.

**7 ප්‍රශ්නය**

7. පුද්ගලයා මුහුණපාන සමකාලීන සංකීර්ණ සමාජ ප්‍රශ්න කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන කවීන් සමත් වී ඇති ආකාරය නූතන පද්‍ය සංග්‍රහයේ ඇතුළත් පද්‍ය පන්ති **තුනක්වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න.


**පිළිතුරු**

නූතන කවියේ කැපී පෙනෙන ප්‍රවණතාවක් වන්නේ සමකාලීන සමාජ ප්‍රශ්න කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට නූතන කවියා දක්වන සාමර්ථ්‍යය යි. දූෂ්පෝෂණය නිසා පීඩනයට පත්වන ළමා පරපුර, පංති විෂමතාව, දරිද්‍රතාව හේතුවෙන් දුරස්ථ වන පුද්ගල සම්බන්ධතා, මත්ද්‍රව්‍ය ලෝලිත්වය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ආදී සමකාලීන සමාජ ප්‍රශ්න කවියට විෂය වී තිබේ.

දිවා භෝජනය, එතෙර ගිය පොඩි දුවට, මිතුරන් දෙදෙනා හා පොරව, දෙදෙනාම දියණියෝ, වංකගිරියට මාරු වීම, වලව්වට වැසි ඇවිත්, සුරා සොඬ සැමි වලප, ගේ කුරුල්ලෝ සහ වී කුරුල්ලෝ ආදි පද්‍ය නිර්මාණ පිළිබඳ ව අවධානය යොමු කරමින් පිළිතුරු ලිවීම මෙහි දී අපේක්ෂා කෙරේ.


(ලකුණු 15 යි.)

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 62%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 26%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 22%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 61%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

පුද්ගලයා මුහුණපාන සංකීර්ණ සමාජ ප්‍රශ්න කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කර ඇති ආකාරය පද්‍ය පන්ති තුනක්වත් ආශ්‍රයෙන් විමසා බැලීම මේ ප්‍රශ්නයේ අරමුණයි. මෙහි පහසුතාව මගින් පෙනෙන්නේ සාධන මට්ටම ද මධ්‍යස්ථ ස්වරූපයකින් පවතින බවයි. අදාළ තොරතුරු නිර්දිෂ්ට පද්‍ය පන්තිවලින් ඉදිරිපත් වුවත් ප්‍රශ්නයට අදාළ වන ආකාරයෙන් නිවැරදි ව කරුණු දැක්වීමෙහි දුර්වලතාවක් මතු වී පෙනිණි.

**නිගමන හා යෝජනා**

මේ ප්‍රශ්නයේ දී පද්‍ය පන්ති තුනක්වත් නිදසුන් කොටගැනීමට අවස්ථාව සලසා දීම නිසා වඩාත් විවෘත ස්වරූපයක් දක්නට ලබේ. නිර්දිෂ්ට නූතන පද්‍ය සංග්‍රහයේ එක් එක් පද්‍ය පන්තිය ආශ්‍රයෙන් මතු කර ගත හැකි විවිධ විචාරාත්මක කරුණු කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කිරීම වැදගත් වේ. නූතන පද්‍ය පරිශීලනයේ දී ඒවායින් පිළිබිඹු වන සමාජ ස්වරූපය හා මානව චර්යා මතුවන ආකාරයෙන් නිදසුන් දැක්වීමටත්, විචාරාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමටත් අපේක්ෂකයන් මෙහෙයවීම මෙහි දී අවශ්‍ය වේ.

**8 ප්‍රශ්නය**

8. රත්නාවලී නාට්‍යය රචනයේ දී කතුවරයා අනුගමනය කළ ශිල්පීය උපක්‍රම කොතෙක් දුරට සාර්ථක වී ඇත් දැ'යි විමර්ශනය කරන්න.

**පිළිතුරු**


රත්නාවලී නාට්‍යය රචනයේ දී කතුවරයා යොදා ගෙන ඇති ශිල්පීය උපක්‍රම මූලික වශයෙන් ම සංස්කෘත නාට්‍ය කලාවට ආවේණික ලක්ෂණ සමග බැඳී ඇත. ඒ අනුව:

- ආරම්භ, යත්න, ප්‍රාප්ත්‍යාශා, නියතාප්ති, ඵලාගම යන අවස්ථා ඔස්සේ සන්දර්භය ගොඩ නැගීම මූලික කොට ගනිමින්
- හාස්‍ය රසය දැනවීම
- කුතුහලය දනවන පරිදි අවස්ථා, සිද්ධි විකාශනය කිරීම
- කඩිනමින් සිද්ධි ගලා යාම

ආදී කරුණු පිළිබඳ ව නාට්‍ය පෙළ ඇසුරෙන් විමසා බැලීම අවශ්‍ය වන අතර ප්‍රස්තාවනාව, ප්‍රවේශකය, විෂ්කම්භය වැනි සංස්කෘත නාට්‍ය කලාවට සම්බන්ධ අනෙකුත් අංග පිළිබඳව ද දැනුම ප්‍රකාශ වීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.


(ලකුණු 15 යි.)

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 31%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 6%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 6%ක් වන අතර 53%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි.


**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

නිර්දිෂ්ට ප්‍රශ්න අතුරෙන් ඉතා අඩු පහසුතාවක් අපේක්ෂකයන් තුළින් විද්‍යමාන වන්නේ මේ ප්‍රශ්නයට සපයා ඇති පිළිතුරුවලිනි. මෙය සරල ප්‍රශ්නයක් වුවත් පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අපහසුතාවකට පත් වූවා සේ පෙනේ. නාට්‍යයක කථා වස්තුවට අමතර ව එහි ශිල්පීය ලක්ෂණ, චරිත නිරූපණය, සන්දර්භ ලක්ෂණ හා අවස්ථා සම්බන්ධය ආදී කරුණු ද ඇතුළත් වන බව අපේක්ෂකයන් අවබෝධ කර ගෙන නො තිබූ බවත්, එබඳු කරුණු සමග නාට්‍යය සම්බන්ධ කර ගනිමින් පිළිතුරු ගොනු කිරීමට අපේක්ෂකයන් අසමත් වූ බවත් පෙනේ.


**නිගමන හා යෝජනා**

රත්නාවලී නාට්‍ය රචනයේ දී කතුවරයා අනුගමනය කොට ඇත්තේ සංස්කෘත නාට්‍යයෙහි සුලබ ශිල්පීය උපක්‍රම යි. නිර්දිෂ්ට රත්නාවලී නාට්‍ය කෘතියේ ප්‍රස්තාවනාවෙහි ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ද මෙම ශිල්පීය උපක්‍රම දක්වා ඇත. එහෙත් අපේක්ෂකයන් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ බවක් නො පෙනේ. රත්නාවලිය වැනි නාට්‍යයක් කියවීමේ දී එය සංස්කෘත නාට්‍යයක අනුවාදයක් බැවින් සංස්කෘත නාට්‍යයෙහි ශිල්පීය උපක්‍රම ගැන පුළුල් දැනුමක් ඇති කර ගැනීමට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු ය.

2.1.3 **I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




1 ප්‍රශ්නයේ අනුකොටස් 23 අතුරෙන් 30%කට වඩා අඩු පහසුතා ලබා ඇති අනුකොටස් 9ක් ම ඇත. අනුකොටස් 16ක් පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍ය අවබෝධය ඇසුරෙන් සකස් වී ඇති අතර ඉන් 6ක ම පහසුතාව 30%කට අඩු ය. තව ද නිර්දිෂ්ට ග්‍රන්ථ අවස්ථා සම්බන්ධය ඇසුරෙන් අනුකොටස් 6ක් ඇති අතර ඉන් කොටස් 3ක ම පහසුතාව 31%කට අඩු ය. 1 හි (ඌ) කොටස රසාස්වාදය ඇසුරෙන් සකස් කර ඇති අතර එහි පහසුතාව 55%කි. ප්‍රශ්න අංක 2 සිට 8 දක්වා ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 3ක් සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් ද ඉතිරි ප්‍රශ්න 4 නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් ද සැකසී ඇති අතර ඒවායේ පහසුතාව 42% සිට 61% අතර විසිරී පවතී.




සමස්ත පහසුතාව සැලකීමේ දී 32%ක් වන අඩු ම පහසුතාව නිර්දිෂ්ට ග්‍රන්ථ අවස්ථා සම්බන්ධය ඇසුරෙන් සැකසූ ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවලට ලැබී ඇත. එමෙන් ම 46% වන ඊළඟ පහසුතාව පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍යය අවබෝධයට ලැබී ඇත. එබැවින් ඉහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී යොමු කළ යුතු ය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - මෙම කොටසට වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.

II කොටස - අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 7කි. 2 හා 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ 2 හා 3 ප්‍රශ්නවලට ලකුණු 25 බැගින් ද, සෙසු ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද ලැබේ.

II පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 80 = 100

## 2.2.2. II ප්‍රශ්න පත්‍රයේ I කොටස

එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **අඝෝෂ මහාප්‍රාණාක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ඝ, ඛ, ඡ, ධ, භ (2) ඝ, ඨ, ඡ, ඵ, භ (3) ඛ, ඡ, ඨ, ථ, ඵ
(4) ඛ, ඡ, ඩ, ථ, ඨ (5) ඡ, ථ, ධ, ඵ, භ (.........)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) උච්ඡාරණය, උද්ඝෝෂණය, පරිගණකය, දෘෂ්ඨිගෝචර, සමස්ථලංකා
(2) උච්චාරණය, උද්ඝෝෂනය, පරිගණකය, දෘෂ්ඨිගෝචර, සමස්තලංකා
(3) උච්ඡාරණය, උද්ඝෝෂණය, පරිඝනකය, දෘෂ්ටිගෝචර, සමස්ථලංකා
(4) උච්චාරණය, උද්ඝෝෂණය, පරිගණකය, දෘෂ්ටිගෝචර, සමස්තලංකා
(5) උච්චාරණය, උද්ඝෝෂනය, පරිඝණකය, දෘශ්ටිගෝචර, සමස්තලංකා (.........)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) අඹ, දඹ, නාරං, කෙසෙල් (2) අන්නාසි, මිදි, පැපොල්, ලොවි
(3) ඇපල්, ජම්බු, රඹුටන්, දූරියන් (4) උගුරැස්ස, වරකා, දිවුල්, දෙළුම්
(5) කොමඩු, දොඩම්, සියඹලා, හිඹුටු (.........)

1.4. පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) 'අඃ' යන්න විසර්ගය, ද්විබින්දු, අනුස්වාර යන නාමයන්ගෙන් ද හැඳින්වේ.
(2) 'අඃ' සහ 'හ්' යන අක්ෂර භාවිතයේ වෙනසක් නැත.
(3) 'අඃ' යන්න වෙනුවට 'අං' යන්න ද යෙදිය හැකි ය.
(4) 'අඃ' යන්න කණ්ඨජ අක්ෂරයකි.
(5) 'ඃ' යන්න හල් අක්ෂරයකට පසුව ද යෙදේ. (.........)

1.5. **යංශය, රේඵය, රකාරාංශය හා ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වාක්‍යය, ස්වර්ගීය, වක්‍ර, වනෞෂධ (2) භාග්‍යය, අක්‍රමවත්, බෞතීස්ම, සර්‍ගය
(3) ගද්‍යය, අලෞකික, චර්‍ම, වෘතය (4) ව්‍යය, අවර්‍ණ, අබෞද්ධ, ක්‍රියශක්තිය
(5) ශාක්‍ය, ප්‍රබල, සම්පීණය, මෞන (.........)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) පියෙදු කිරිය, මිහිඳු තෙර, රජමහා විහාරය, අගමැති මන්දිරය
(2) සූර්ය මණ්ඩලය, භාරත දේශය, තෑගි ප්‍රදානය, ඡන්දස් ශාස්ත්‍රය
(3) හස්තිශෛල පුරය, විද්‍යුත් ආලෝකය, ථූප වංශය, මූල්‍ය ප්‍රතිපාදන
(4) කාන්තා කාර්යාංශය, රාජ්‍ය සභාව, සන්ධ්‍යා පුවත්, යහ පාලනය
(5) සර සඳ, සුබ පැතුම්, ලිඟු අදියර, අග විනිසුරු (.........)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) නිති, වීථි, හිති, බාති (2) ආලෝක, ආලාප, ආහාර, ආකාර
(3) සුන්දර, මන්දර, ගින්දර, කින්නර (4) දේශිත, භාෂිත, බාධිත, සාදත
(5) සිරි, දිරි, පිරි, කිරි (.........)

1.8. මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) අසංවර - සංවර, සංයත, දැමුණු, දාන්ත (2) වංක - නොවක්, අවංක, අකුටිල, ඍජු
(3) අප්‍රධාන - ප්‍රමුඛ, ප්‍රධාන, මුඛ්‍ය, අවශේෂ (4) අසරණ - පිහිට, සරණ, උපකාර, උදව්
(5) දුඃඛ - ප්‍රීති, සුඛ, සන්තුෂ්ටි, ප්‍රහර්ෂ (.........)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) වන - අරණ්‍ය, අටවි, කැළය, අරණ (2) ශක්‍රයා - විදුරවි, වජ්‍රපාණි, සහසැස්, පුරඳුරු
(3) වායු - වාත, සුළඟ, අනිල, මාරුත (4) ආචාර්ය - ඇදුරු, ගුරු, ශික්ෂක, අධ්‍යාපක
(5) චන්‍ද්‍රයා - තාරපති, නිශාකර, සිසි, දිනකර (.........)

1.10. **විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ, අව්‍යය** යන සමාසවලට අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පරපුටු, දසපනත, දසබල, දුසිරිත් (2) තැඹිලිතෙල්, සුන්බත්, තිලෝ, අබල
(3) ගත්කරු, නරසී, අනුවර්තන, සඳවත් (4) ගිනිබිය, ලඹසවන්, රතුපුල්, ප්‍රබුද්ධ
(5) බඹලොව, නිවහල්, දැමිඳුරු, නිල්අහස (.........)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) පෑ, ගෑ, කෑ, ලෑ (2) මැරුම්, හැඳුම්, රවුම්, වැටුම්
(3) බැලෙනා, නැටෙනා, ඇකෙනා, ඇඳෙනා (4) ස්මරණ, කරණ, චරණ, මරණ
(5) දිවීම්, පැනීම්, වැලපීම්, ගැයීම් (.........)

1.12. පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න

(අ) "සැළලිහිණිය **වදු** කැලණිය පුරවරට"
(ආ) "**සිඳිත**, මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ"
(ඉ) "**පාලා** ගිය වැනි බහුරූ කෝලම්"
(ඊ) "ආයු බෝ **වේවා!**"

(1) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා
(3) ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(4) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, ආශීර්වාදක්‍රියා
(5) ආශීර්වාදක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා (.........)

1.13. **අනුක්ත පද දෙකක්** හා **උක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.

(1) දෙවඟනක, ඊරියක්, පාලකයෙක්, ඇතැමෙක්
(2) පැටවකු, මුනිදාසයන්, මහතකු, නයෙක්
(3) කෙනකු, අප, අම්මාවරුන්, රෝගියෙක්
(4) අසන්නෙක්, රඟන්නකු, මනාලියක්, ඇතෙක්
(5) වඳුරකු, නැණවතෙක්, තා, බැල්ලියක් (.........)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(1) අවගමන, අවගුණ, අවතල, අවපාත
(2) ඉම්හිරි, ඉපැරණි, ඉබොහෝ, ඉවහල්
(3) වියෝග, විදුලිය, විචල්‍ය, විසන්ධි
(4) සුමුදු, සුමට, සුසුදු, සුදුල
(5) සංයුක්ත, සංයෝග, සංප්‍රේෂණ, සංපීඩ්‍යතා (.........)

1.15. "**වෛශාඛෝත්සවය අනුස්මරණය** කරනු වස් **දර්ශනීය** තොරණ ඉදිකිරීම **අද්‍යතන** සම්ප්‍රදායයයි" යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, සමාස, කෘදන්ත හා තද්ධිත
(2) සන්ධි, සමාස, තද්ධිත හා කෘදන්ත
(3) සමාස, සන්ධි, තද්ධිත හා කෘදන්ත
(4) තද්ධිත, සන්ධි, කෘදන්ත හා සමාස
(5) සන්ධි, තද්ධිත, කෘදන්ත හා සමාස (.........)

1.16. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?

(1) වන්දනීය, පූජනීය, කරණීය, යාපනීය
(2) කොල, එම්බා, බොල, එම්බල
(3) මුහුණත, සවනත, අවනත, නුවනත
(4) වයෝවෘද්ධ, යශෝරාව, තපෝධර, මනෝවෘත්ති
(5) බලව, නටන්න, කියග, අස (.........)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.

(1) ගල්පඩි, රන්කම්, දීබත්, ළමාපොත්
(2) දුදන, දුහුල, දුලද, දුබල
(3) පැරකුම්නිරිඳු, මහඔසුපඬි, දනපල්ඇත්, මලියදෙව්තෙර
(4) සිහවගවලස්, පලුපලමල්, ඇඳපුටුමේස, ඇස්කන්නාස්
(5) වතකමල, තිසරතන, අතුල්පියුම්, නෙතුපුල (.........)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.

(1) අතිනත, දකුණත, දිගත, සුරත
(2) කොස්සැට, උරුමක්කාර, අල්ලස්, පොල්ලත්ත
(3) ශාස්ත්‍රාලය, මුනීන්‍ද්‍ර, ක්‍රිස්තුත්පත්තිය, යථාර්ථ
(4) ජාත්‍යාලය, විද්‍යාලය, හස්ත්‍යලංකාර, කාව්‍යාවලිය
(5) පුනරුත්, මෙයාකාර, කටුවල, ඇවුරුදු (.........)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.

(1) අවුරුදු කාලයෙහි මඟ දෙපස සල්පිල් ඇත්තාහ.
(2) ජපන්නු හපන්නු ලූ.
(3) අමාත්‍යතුමා ජනතාව අමතනු ලබයි.
(4) සියලු ඥාතිමිත්‍රාදීන් මේ කණගාටුදායක නිවේදනය පිළිගනිත්වා!
(5) එක් කෙනෙක් තරගය ජයග්‍රහණය කළහ. (.........)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.

(1) භාෂාසංවර්ධනයෙහි ලා භාෂාප්‍රේමීත්වය මහ මෙහෙයක්ඉටුකරයි.
(2) පරාක්‍රමබාහුමහරජාණන්වහන්සේ පොළොන්නරුව අග්‍රරාජධානිය කර ගත් හ.
(3) ආක්‍රමණශීලී ශාකයක් වන යෝධ නිදිකුම්බා පරිසරයට අතිශයින් හානිකර ය.
(4) වැලවරකාකජ්ජුපුහුලන් යනු වවුලන් බෙහෙවින්ම ප්‍රියකරන පලතුරු ය.
(5) සත්‍යය ගරුකරන්නා වූ ත් ප්‍රඥා ව දල්වන්නා වූ ත් මනුෂ්‍යප්‍රජාවක් රටට අවශ්‍ය ය. (.........)

(ලකුණු 20 යි.)

2.2.3 **II** පත්‍රයේ **I** කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | 3 |
| 1.2 | 4 |
| 1.3 | 5 |
| 1.4 | 4 |
| 1.5 | 1 |
| 1.6 | 5 |
| 1.7 | 2 |
| 1.8 | 3 |
| 1.9 | 5 |
| 1. 10 | 1 |
| 1. 11 | 2 |
| 1. 12 | 4 |
| 1. 13 | 5 |
| 1. 14 | 3 |
| 1. 15 | 1 |
| 1. 16 | 3 |
| 1. 17 | 2 |
| 1. 18 | 3 |
| 1. 19 | 2 |
| 1. 20 | 3 |

**2.2.4** II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 |
| 1.1 | 3 | 14% | 5% | 73% | 5% | 3% |
| 1. 2 | 4 | 11% | 14% | 5% | 68% | 2% |
| 1. 3 | 5 | 5% | 6% | 5% | 2% | 82% |
| 1. 4 | 4 | 18% | 30% | 3% | 42% | 7% |
| 1. 5 | 1 | 98% | 1% | | | 1% |
| 1. 6 | 5 | 8% | 24% | 24% | 19% | 25% |
| 1. 7 | 2 | 15% | 16% | 15% | 42% | 12% |
| 1. 8 | 3 | 5% | 26% | 53% | 10% | 6% |
| 1. 9 | 5 | 9% | 16% | 8% | 9% | 58% |
| 1. 10 | 1 | 59% | 17% | 6% | 14% | 4% |
| 1. 11 | 2 | 14% | 52% | 4% | 26% | 4% |
| 1. 12 | 4 | 14% | 14% | 1% | 70% | 1% |
| 1. 13 | 5 | 4% | 16% | 16% | 6% | 58% |
| 1. 14 | 3 | 3% | 29% | 48% | 10% | 10% |
| 1. 15 | 1 | 51% | 29% | 6% | 4% | 10% |
| 1. 16 | 3 | 15% | 9% | 23% | 30% | 23% |
| 1. 17 | 2 | 19% | 32% | 15% | 12% | 22% |
| 1. 18 | 3 | 32% | 14% | 15% | 32% | 7% |
| 1. 19 | 2 | 5% | 34% | 24% | 25% | 12% |
| 1. 20 | 3 | 1% | 1% | 92% | 2% | 4% |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

**2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න 20ට ම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල ප්‍රශ්න පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I කොටසේ ප්‍රශ්න 20ට ම පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් සාමාන්‍යයෙන් පැය භාගයක කාලයක් ඒ සඳහා යෙදීම ප්‍රමාණවත් වේ යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවේ ඇති ප්‍රස්තාරයෙහි හා 33 පිටුවේ ඇති වගුවේ දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව 75%ඉක්මවා පෙන්වන්නේ 1.3, 1.5 හා 1.20 ප්‍රශ්නයි. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසුතම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වේ. එම ප්‍රශ්න අතුරෙන් අංක 1.5 ප්‍රශ්නය වඩාත් පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 98%ක් වේ. මීළඟට පහසු ප්‍රශ්නය වී ඇත්තේ අංක 1.20යි. එහි පහසුතාව 92%ක් වේ. අනතුරුව 82%ක පහසුතාව ඇත්තේ අංක 1.3 ප්‍රශ්නයට ය.

මෙහිදී අංක 1.5 ප්‍රශ්නයෙන් විමසා ඇති අක්ෂර සංකේත යෙදීමේ අනුපිළිවෙළ ඉතා ඉහළ අයදුම්කරුවන් සංඛ්‍යාවකගේ පහසුතාවට ලක්ව ඇත. අංක 1.20 ප්‍රශ්නයෙහි නිවැරදි පද බෙදීම දී ඇති වරණ ඔස්සේ පහසුවෙන් හඳුනා ගැනීමට අපේක්ෂකයන් සමත් වී ඇත. අංක 1.3 ප්‍රශ්නයෙහි අකාරාදී පිළිවෙළෙහි ඇති සරල ස්වරූපය හේතුවෙන් ඉතා පහසුවෙන් අදාළ පිළිතුර හඳුනා ගත් බව පැහැදිලි වේ.

අංක 1.1, 1.2, 1.8, 1.9, 1.10, 1.11, 1.12, 1.13 හා 1.15 යන ප්‍රශ්නවල පහසුතාව 50%-75% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිසුනට පහසු වී ඇති බව අනාවරණය වේ. අංක 1.4, 1.14, 1.17 හා 1.19 යන ප්‍රශ්නවල පහසුතාව 30%-50% අතර ප්‍රාන්තරයට අයත් වේ.

අංක 1.6, 1.7, 1.16 හා 1.18 යන ප්‍රශ්නවල පහසුතාව 30%ට වඩා අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අයදුම්කරුවන්ට නිවැරදි ව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒ අතුරෙන් වඩාත් ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ අංක 1.18 ප්‍රශ්නයයි. එහි පහසුතාව 15%ක් වේ. එසේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත්තේ අපේක්ෂකයන් තුළ සන්ධි විශ්ලේෂණය පිළිබඳ ව පැවති අනවබෝධය බව පෙනී යයි.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 පිළිවෙළින් භාෂා කුසලතා, ව්‍යාකරණය, අවබෝධය හා විශ්ලේෂණය යන ප්‍රධාන තේමාවලට යෝග්‍ය ආකාරයෙන් සකස් කර ඇත. භාෂා කුසලතා යටතේ අක්ෂර වින්‍යාසය (1.1, 1.2, 1.4, 1.5), අකාරාදී පිළිවෙළ (1.3), වචන කෝෂය (1.6, 1.7, 1.8 හා 1.9) පද බෙදීම (1.20) යන අංශවලට අදාළ ව ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

ව්‍යාකරණය යන තේමාව යටතේ 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18 හා 1.19 යන ප්‍රශ්න ඇතුළත් කළ හැකි ය. අවබෝධය හා විශ්ලේෂණය මේ සෑම ප්‍රශ්නයක් සමග ම අනුබද්ධ ව පවතී. සෑම ප්‍රශ්නයක් ම යොමු වන්නේ වරණ පහක් යටතේ ය. එම වරණ පහෙන් යෝග්‍ය වරණය තෝරා ගැනීමේ අවබෝධය අපේක්ෂකයන් තුළ තිබිය යුතු ය. විශ්ලේෂණය ද මේ සියලු ප්‍රශ්න සමග බැඳී පවතී. මෙහි දී එක් එක් වරණය විශ්ලේෂණය කරමින් දැනුම හා අවබෝධය උපයෝගී කර ගෙන වඩාත් යෝග්‍ය වරණය තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු කෙරෙන බව කිව යුතු ය.

සිංහල II පත්‍රයෙහි I කොටසට අයත් බහුවරණ ප්‍රශ්න 20 පහත දැක්වෙන පරිදි ප්‍රධාන තේමා තුනක් යටතේ වර්ගීකරණය කළ හැකි වේ.

- භාෂා කුසලතා - 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6, 1.7, 1.8, 1.9, 1.20
- ව්‍යාකරණය - 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18, 1.19
- අවබෝධය හා විශ්ලේෂණය - 1.1 - 1.20 දක්වා ප්‍රශ්න 20 ම

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 10ක් ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාව යටතේ ය. II පත්‍රයට හිමි මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් මෙයට වෙන් වන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 20 අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 1.5වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 98%කි. මීළඟට මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් අංක 1.20, 92%ක පහසුතාවක් ද, අංක 1.3, 82%ක පහසුතාවක් ද දක්වා ඇත. ඒ අනුව වඩාත් පහසු ප්‍රශ්න තුන ම ඇතුළත් ව ඇත්තේ භාෂා කුසලතා තේමාවට ය. ඒ සෑම ප්‍රශ්නයක ම පහසුතාව 80% ඉක්මවා ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර බවක් පෙන්වන්නේ අංක 1.6 හා 1.7 ප්‍රශ්න වේ. ඒවායේ පහසුතාව පිළිවෙළින් 25% හා 16% වේ. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 1.7 ප්‍රශ්නයට අයදුම්කරුවන් දී ඇති පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් දෙවන වරණය තෝරා ඇති අයදුම්කරුවන්ගේ පහසුතාව 16%කි. අයදුම්කරුවන්ගෙන් 15%ක් පළමු වරණය ද, 15%ක් තුන්වන වරණය ද, 42%ක් සිවුවන වරණය ද, 12%ක් පස්වන වරණය ද පිළිතුර ලෙස තෝරා ඇත.

අංක 1.7 යටතේ දී ඇති ප්‍රශ්නය වන්නේ 'තත්සම පද පමණක් යෙදී ඇති වරණය දී ඇති වරණ අතුරෙන් තෝරා ගැනීම' යන්නයි. තත්සම හා තද්භව පද වෙන් කර හඳුනා ගැනීමට අපේක්ෂකයන්ගේ දැනුම ප්‍රමාණවත් වී නොමැති බව මින් අනාවරණය වේ.

භාෂාවක් අධ්‍යයනය කිරීමේ දී පොත් පත් සඟරා මෙන් ම ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනයට ගුරුවරුන් යොමු වීම සහ සිසුන්ට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම මෙහි දී වැදගත් වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍යයක පහසුතාව ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත කුසලතාව 61%කි.


**ව්‍යාකරණ**

සිංහල II පත්‍රයෙහි I කොටසෙහි ව්‍යාකරණ තේමාව යටතේ ප්‍රශ්න 10ක් අඩංගු වී ඇති අතර මුළු ප්‍රශ්න පත්‍රයේ ලකුණුවලින් 10%ක් එම තේමාවට වෙන් ව තිබේ. එම ප්‍රශ්න 10 අතුරෙන් වැඩි ම පහසුතාව වන 70%ක අගයක් ලබා ගෙන ඇත්තේ අංක 1.12 ප්‍රශ්නය යි. මීට අමතර ව අංක 1.10, 1.11, 1.13 හා 1.15 යන ප්‍රශ්න පිළිවෙළින් 59%, 52%, 58% හා 51% යනා දී වශයෙන් පහසුතා අගයක් පෙන්වා ඇත. ව්‍යාකරණ තේමාව යටතේ අඩු ම පහසුතාවක් පෙන්වා ඇත්තේ 1.18වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 15%කි. මෙම ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර අයත් වන්නේ 3වන වරණයට වුවත් එය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 15%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 32%ක් පළමුවන වරණය ද, 14%ක් දෙවන වරණය ද, 32%ක් හතරවන වරණය ද, 7%ක් පස්වන වරණය ද තෝරා ගෙන ඇත. සරල වියරණ රීති පිළිබඳ ව අයදුම්කරුවන් තුළ ඇති අනවබෝධය මෙහි දී කැපී පෙනේ. සන්ධි පද පිළිබඳ ව නිශ්චිත ව නො දැනීම නිසා එක් සන්ධියක් තවත් සන්ධියකින් වෙන් කර හඳුනා ගැනීමට අපේක්ෂකයන් අසමත් ව ඇත. මේ අතර සන්ධි පිළිබඳ ප්‍රශ්නය නිරවුල් ව හඳුනා ගත් අපේක්ෂකයන් පිරිසක් ද සිටි බව පැහැදිලි වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍යයක පහසුතාව ගණනය කළ විට ව්‍යාකරණ තේමාවේ සමස්ත පහසුතාව 44%කි.

**අවබෝධය හා විශ්ලේෂණය**


සිංහල II පත්‍රයේ I කොටසෙහි ඇතුළත් ප්‍රශ්න 20 ම අවබෝධය හා විශ්ලේෂණය පාදක කොටගෙන ඉදිරිපත් කෙරේ. අපේක්ෂකයන් නිවැරදි වරණය තෝරා ගැනීමේ දී දක්වා ඇති සියලු වරණ විශ්ලේෂණය කොට නිවැරදි වරණය පමණක් තෝරා ගැනීම සඳහා යෝග්‍ය අවබෝධයකින් යුක්ත විය යුතු ය. මේ කරුණු දෙක කෙරෙහි ම අනවධානයෙන් යුක්ත ව වැරදි වරණයක් තෝරා ගත් අවස්ථා කිහිපයක් දක්නට ඇත. අංක 1.6, 1.7, 1.16 හා 1.18 යන ප්‍රශ්න නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. අවබෝධය හා විශ්ලේෂණ හැකියාවෙන් දුර්වල අයදුම්කරුවෙකුට වුව ද මෙම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමට හැකිව තිබුණි. අපේක්ෂකයන් විසින් භාෂා භාවිතය පිළිබඳ ව ලියැවුණු පොතපත මෙන් ම නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ ද මැනවින් පරිශීලනය කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ.

2.2.6 **II** ප්‍රශ්න පත්‍රයේ **I** කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) :




ඉහත වර්ගීකරණය අනුව 50%ට වැඩි පහසුතා ලබා ඇත්තේ අක්ෂර වින්‍යාසය යටතේ ප්‍රශ්න 4න් 3ක් ද, අකාරාදී පිළිවෙළ යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද, වචන කෝෂය යටතේ දී ඇති ප්‍රශ්න 4න්, 2ක් ද, පද බෙදීම යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද, පද වර්ගීකරණය යටතේ දී ඇති ප්‍රශ්න 8න් 4ක් ද වාක්‍ය නිර්මාණය යටතේ දී ඇති ප්‍රශ්න 2න් 1ක් ද වේ. වචන කෝෂය යටතේ 20%ටත් වඩා අඩු පහසුතා 1.7 ප්‍රශ්නයට හා පද වර්ගීකරණය යටතේ 1.18 ප්‍රශ්නයට ලැබී ඇත.

| වර්ගීකරණය | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩිම | | පහසුතාව අඩුම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රශ්නය | පහසුතාව | ප්‍රශ්නය | පහසුතාව |
| 1. අක්ෂර වින්‍යාසය | 4 | 1.5 | 98% | 1.4 | 42% |
| 2. අකාරාදී පිළිවෙළ | 1 | 1.3 | 82% | - | - |
| 3. වචන කෝෂය | 4 | 1.9 | 58% | 1.7 | 16% |
| 4. පද බෙදීම | 1 | 1.20 | 92% | - | - |
| 5. පද වර්ගීකරණය | 8 | 1.12 | 70% | 1.18 | 15% |
| 7. වාක්‍ය නිර්මාණය | 2 | 1.13 | 58% | 1.19 | 34% |




II ප්‍රශ්න පත්‍රයේ I කොටසේ වර්ගීකරණය අනුව පහසුතාව ඉහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ. ඒ අනුව පද බෙදීම යටතේ දී තිබූ එක ම ප්‍රශ්නය සඳහා වැඩි ම පහසුතාවක් ලබා ගෙන ඇත. එය 92%ක් වේ. ඊළඟට වැඩි ම පහසුතාව 82%ක් ලබා ගෙන ඇත්තේ අකාරාදී පිළිවෙළ යටතේ දී තිබූ එක ම ප්‍රශ්නයට ය. අනතුරුව සමස්ත පහසුතාව සැලකූ විට අක්ෂර වින්‍යාසය යටතේ දී තිබූ ප්‍රශ්න 4 සඳහා ඊළඟට වැඩි ම පහසුතාව වන 70% හිමි කර ගෙන ඇත. අඩු ම පහසුතාව ලබා ඇත්තේ වචන කෝෂය යටතේ අසා ඇති ප්‍රශ්න 4ට ය. එහි සමස්ත පහසුතාව 38%කි.

## 2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**II ප්‍රශ්න පත්‍රය**

**II කොටස**

### 02 ප්‍රශ්නය

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලක්දිව දේශපාලන සංස්ථා විකාශනය දෙස අවධානය යොමු කිරීමේ දී දක්නට ලැබෙන භාරතීය සංස්ථාවල ආභාසය ද විමසිල්ලට ලක් විය යුතු ය. ලක්දිව පාලන තන්ත්‍රයෙහි භාරතයේ ඍග්වේද කාලය තරම් ඈත අවධියක එන ග්‍රාමණී වැනි නිලධාරීහු ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම හමු වෙති. එසේ වුව ද ඔවුනට අයත් කාර්යයන් හෝ තත්ත්වය අතින් හෝ ඔවුනොවුන් සමාන කළ නොහැකි බැව් සිහිපත් කළ යුතු වේ. භාරතයේ ප්‍රකට ව දක්නට ලැබෙන 'මහරජ' වැනි රාජවිරුද සිංහල රජවරුන් මුල සිට ම ව්‍යවහාර කළ බවට සෙල්ලිපි දෙස් දෙයි. රාජාභිෂේකය වැනි උත්සව පිළිබඳ ව ප්‍රමාණවත් සාධක ශේෂ වී නැතත්, එහි දී භාරතීය අභිෂේකයේ බලපෑමක් නොතිබිණැ'යි කිව නො හැකි ය. දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකය අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් සිදු කරන ලද්දේ නම් එහි දී භාරතීය පිළිවෙත් ගරු කළ බැව් සිතීමට ඉඩ තිබේ. එහෙත් භාරත රජවරුන් සාර්වභෞම බව දක්වමින් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ අශ්වමේධ රාජසූය වැනි යාගහෝම මෙරට රාජත්වය විකාශනයෙහි කිසි ම අවස්ථාවක දක්නට නො ලැබේ. රාෂ්ට්‍රපාලනයේ ප්‍රධාන ලක්ෂණ ලෙස කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයේ දැක්වෙන අන්දමට යුද්ධ හමුදාව (දණ්ඩ) භාණ්ඩාගාරය (කෝෂ) හා චරපුරුෂ සේවය මහාපරාක්‍රමබාහුගේ පාලන යන්ත්‍රයේ ද ප්‍රමුඛ අංගලක්ෂණ බවට පත් වී තිබුණු බැව් දක්වා ඇතත් එම ප්‍රවෘත්තිය වුව ද එසේ ම පිළිගත යුතු නො වේ. පරාක්‍රමබාහු රජුගේ චරිත නිරූපණයේ දී මෙන් ම රාජ්‍යපාලන සංවිධාන විස්තර කිරීමේ දී චූලවංසකරු කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය ආධාර කර ගැන්ම ද සිදු වීමට ඉඩ තිබුණු බැවිනි. එහෙත් මෙකී බලපෑම්වල ප්‍රකෘති ස්වරූපය පිළිබඳ ව වඩාත් පරීක්ෂාකාරී වීමේ දී, එකී සංස්ථා ද දේශීය බලපෑම් අනුව විකාශනය වූ බැව් සැලකීමට පිළිවන. මේ ගැන විවරණයකට මෙහි අවකාශ නැතත්, ලක්දිව රාජත්වය විකාශනය වූ ආකාරය මීට කදිම නිදර්ශනයකි.

(i) භාරතීය රජවරුන් විසින් බහුල ව භාවිත කරන ලද මහරජ වැනි විරුද නාම ලංකාවේ රජවරුන් විසින් ද භාවිත කරන ලද ආකාරය තහවුරු කෙරෙන්නේ කවර මූලාශ්‍රයකින් ද?

(ii) රාජාභිෂේකය සම්බන්ධයෙන් භාරතීය සිරිත් විරිත් මෙරටට බලපාන්නට ඇති බව ලේඛකයා පවසන්නේ කුමන කරුණක් නිසා ද?

(iii) කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයෙහි සඳහන් වන රාජ්‍යපාලනය සම්බන්ධ ප්‍රමුඛ අංග මොනවා ද?

(iv) ක්‍රි. පූ. යුගවල සිට ම භාරතීය බලපෑම මෙරට පාලන තන්ත්‍රයට ලැබුණු බවට මෙහි සඳහන් සාක්ෂිය කුමක් ද?

(v) මෙම පාඨයෙහි සඳහන් වන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ තොරතුරු සඳහන් වන වංසකතාව කුමක් ද?

**පිළිතුරු**

(i) සෙල්ලිපිවලින්

(ii) දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකය අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් සිදු කරන ලද්දක් බව සඳහන් වීම

(iii) යුද්ධ හමුදාව (දණ්ඩ), භාණ්ඩාගාරය (කෝෂ) හා චරපුරුෂ සේවය

(iv) ඍග්වේද කාලය තරම් ඈත අවධියක පැවති ග්‍රාමණී නම් නිලනාමය ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ලක්දිව පාලන තන්ත්‍රයේ දී හමුවීම

(v) චූලවංසය

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සුවදායී ජීවිතයක් අපේක්ෂාවෙන් ස්වභාවධර්මය අභිභවනය කොට මනුෂ්‍ය සංහතිය විසින් නිර්මාණය කර ගන්නා ලද තාක්ෂණය මිනිසා විසින් මිනිසාට ම එරෙහිව යෙදවීම විසිවන සියවසේ වඩාත් තදින් තහවුරු විය. න්‍යෂ්ටික අවි නිෂ්පාදනය සහ අධිරාජ්‍යවාදී ප්‍රචණ්ඩ යුද්ධ සැලසුම් ද මෙකල අන් සියල්ල අභිභවා ප්‍රමුඛත්වයට පැමිණ ඇත. සමස්ත මානව පැවැත්ම ම ඛේදවාචකයක් බවට පමුණුවාලන මේ තත්ත්වය කලාවේ විෂය ක්ෂේත්‍රය පෘථුලත්වයට පත් කිරීමට හේතු වී තිබේ. අප්‍රිකානු, ඉන්දියානු, වියට්නාම් හා පලස්තීන සාහිත්‍ය කෘති මේ සඳහා මනා නිදසුන් සපයයි. මෙහි ම ප්‍රතිපක්ෂය ගතහොත් මානුෂික පැවැත්මෙහි ද, එහි ප්‍රතිඵල වශයෙන් සාහිත්‍යයේ හා කලාවේ ද විනාශය සිදු කිරීමට ක්‍රියාත්මක වනු ඇත්තේ ද මේ වෛෂයික පදනම ම ය. මානව සංහතිය පෘථිවිතලයෙන් අතුගා දමා දේශදේශාන්තරයන් තමතමන් අතර බෙදා හදා ගැනීමට ලොව මහ බලවතුන් සැලසුම් කරන යුද්ධෝපායයන්ගේ න්‍යෂ්ටිය ලෙස තාක්ෂණය ම ක්‍රියාත්මක වෙයි.

තාක්ෂණය මානව සංහතියේ හා කලාවේ වර්ධනය සඳහා ඉටු කර ඇති එමෙන් ම ඉටු කරන්නා වූ මෙහෙවර අනුපමේය ය. එහෙත් තාක්ෂණය මනා සැලසුම්කරණයකින් යුක්ත කොට ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ උරුමයක් බවට පත් කරන තෙක් එය විලංගු ලා සිර අඩස්සි කළ ලෙසකින් පවතියි. මනුෂ්‍ය ඝාතන ද, ඒ සඳහා ඇති දුෂ්ට සැලසුම් ද සුණුවිසුණු කොට මහජනයාට තාක්ෂණයේ විපුල ඵල නෙළා ගත හැකි වන්නේත්, එය වඩවඩාත් උච්ච මට්ටම කරා වර්ධනය කළ හැකි වන්නේත් එහි පසු ගමන්කරුවකු වන සාහිත්‍යයේ හා කලාවේ පුනර්ජීවනයක් ඇති කළ හැකි වන්නේත්, තාක්ෂණය බැඳ දමා ඇති යදම් ලිහා බහුජන අයිතියට පවරා මානව ප්‍රගතිය ඒකායන අරමුණ කොට ගත් විද්‍යාත්මක සැලසුම්කරණයකට භාජන කිරීමෙන් ම පමණි.

**සාරාංශය**


සාරාංශයේ ඇතුළත් විය යුතු කරුණු පහත දැක්වේ.

- මිනිසා විසින් නිපදවන ලද තාක්ෂණය මිනිසාට ම එරෙහිව යෙදවීම
- කලාවේ විෂය ක්ෂේත්‍රය පළල් වීම
- න්‍යෂ්ටික ආයුධ නිෂ්පාදනය හා අධිරාජ්‍යවාදී යුද සැලසුම් ප්‍රමුඛත්වයට පත්වීම.
- මනුෂ්‍ය ප්‍රජාවේ පැවැත්ම, විනාශය කරා යොමු කිරීමට ද ආයුධ නිෂ්පාදනය හා අධිරාජ්‍යවාදී යුද සැලසුම් හේතු වීම
- මානව සංහතියේ හා කලාවේ වර්ධනය සඳහා තාක්ෂණය යොදා ගැනීමේ අවශ්‍යතාව
- මනා සැලසුම්කරණයකින් තාක්ෂණය භාවිත කිරීම, සාහිත්‍යයේ හා කලාවේ පුනර්ජීවනයට හේතුවන බව


ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබීම අවශ්‍ය ය.
සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු ය. ඡේදවලට බෙදා ඇත්නම් ලකුණු අඩු වේ.
වචන සංඛ්‍යාව 70-80 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 03ක් අඩු වේ.

| | |
|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - ලකුණු 03 යි. |
| අක්ෂර වින්‍යාසයට | - ලකුණු 04 යි. |
| අන්තර්ගතයට | - ලකුණු 08 යි. |

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද එයට පිළිතුරු සපයා ඇත්තේ 93%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 6 ප්‍රාන්තරයේ 1%ක් ද,
ලකුණු 7 - 12 ප්‍රාන්තරයේ 7%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 51%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 51%ක් වන අතර 8%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13කට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය (අ),(ආ) යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර (අ) කොටසේ අනුකොටස් පහ සඳහා ද (ආ) කොටස සඳහා ද පහසුතාව 59% ඉක්මවා ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

2වන ප්‍රශ්නයේ (අ) කොටසෙහි අපේක්ෂකයන්ගේ පහසුතාව ඉහළ මට්ටමක පැවතිණි. තෝරා ගෙන ඇති ඡේදය අපේක්ෂකයන් මැනවින් හඳුනා ගෙන තිබූ අතර ඒ නිසා ම ඍජු පිළිතුරු සැපයීමට ද ඔවුන් සමත් ව තිබිණි. (ආ) කොටසෙහි ඇතුළත් සාරාංශය යටතේ ලියූ පිළිතුරුවල ද පහසුතා මට්ටම උසස් විය. සමස්තයක් ලෙස සැලකීමේ දී මේ දෙකොටස සඳහා සපයා ඇති පිළිතුරු සතුටුදායක මට්ටමක පැවතිණි. 2 - (අ) කොටසේ i, ii, iii අනුකොටස් සඳහා සැපයූ පිළිතුරුවල ඉහළ පහසුතා මට්ටමක් පැවතිණි. මේ කොටස් සඳහා අපේක්ෂකයන් 91%ට වැඩි පහසුතාවක් ලබා ගෙන තිබිණි. එහෙත් (iv) වන අනුකොටසෙහි පිළිතුරුවල දක්නට ලැබුණේ පහසුතා මට්ටම අතින් පහළ තත්ත්වයකි. එය 60%කි. මෙම අනුකොටසෙහි අපේක්ෂිත පිළිතුර දීර්ඝ වූ නිසා අපේක්ෂකයන්ට නිවැරදි ව සියලු තොරතුරු ග්‍රහණය කිරීමට නොහැකි වීම එයට හේතුව ලෙස දැක්විය හැකිය. (v) වන අනුකොටසෙහි පහසුතාව 74%ක් වශයෙන් සඳහන් වීමෙන් පෙනී යන්නේ මුල් අනුකොටස් තුන තරම් පහසුතාව ඉහළ මට්ටමක නො තිබුණු බවයි. මෙයට හේතු වශයෙන් දැක්විය හැක්කේ අදාළ පිළිතුර වෙනත් පිළිතුරු සමග මිශ්‍ර වී පැවතීම ය. මේ නිසා ඇතැම් අපේක්ෂකයන් පිළිතුර අවබෝධ කර ගැනීමට අසමත් වූ බවක් පෙනේ.

2වන ප්‍රශ්නයේ (ආ) කොටසෙහි පහසුතා මට්ටම 64%ක් විය. මෙහි දී නිරූපණය වූයේ මධ්‍යස්ථ තත්ත්වයකි. ඇතැම් අපේක්ෂකයන් අදාළ සියලු කරුණු ඇතුළත් කොට නියමිත වචන ප්‍රමාණය යටතේ සාරාංශය ලියා දැක්වීම වෙනුවට, සම්පූර්ණ ඡේදය සුළු වෙනස්කම් සහිත ව ලියා දැක්වීමටත්, අඩු වචන සංඛ්‍යාවක් යටතේ කරුණු සුළු ප්‍රමාණයක් පමණක් ඇතුළත් කිරීමට යාමත් නිසා පහසුතා මට්ටම දුර්වල වූ බව පෙනේ. මේ අතර ඡේද බෙදීමට ද ඇතැම් අපේක්ෂකයන් පෙලඹී ඇත. අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ දෝෂ ද දක්නට ලැබිණි.

නිගමන හා යෝජනා

අපේක්ෂකයා තුළ ඡේදයක් කියවා අවබෝධ කර ගැනීමේ හැකියාවත්, ඡේදයක් හෝ ඡේද කිහිපයක් සාරාංශකරණය කිරීමේ හැකියාවත් මැන බැලෙන ආකාරයෙන් මෙම ප්‍රශ්නය සකස් වී ඇත. මෙහි (අ) කොටසේ අනුකොටස් සඳහා කෙටි පිළිතුරු අපේක්ෂිත අතර ඡේදයක් කියවා අවබෝධ කර ගැනීමටත් ඒ අනුසාරයෙන් ඇසෙන ප්‍රශ්නවලට ඍජු පිළිතුරු සැපයීමටත් හැකියාව අපේක්ෂකයා තුළ ඇති කිරීම අවශ්‍ය වේ.

මෙම ප්‍රශ්නයේ (ආ) කොටස සාරාංශකරණය සඳහා යොමු වී ඇති බැවින් සාරාංශකරණය පිළිබඳ මනා පරිචයක් අපේක්ෂකයන් තුළ ඇති කිරීමේ අවශ්‍යතාව ඇත. ඒ සඳහා සුදුසු අභ්‍යාසවල නිරත කිරීමේ අවශ්‍යතාව ද මතු වී පෙනෙයි.

## 03 ප්‍රශ්නය

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) රටක සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ආත්මාර්ථයෙන් තොර දේශපාලන සංස්කෘතියක ඇති වැදගත්කම
(ii) සාරධර්ම සපිරි සමාජයක් බිහි කිරීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග
(iii) දේශීය වෛද්‍ය විද්‍යා ප්‍රතිකර්ම මහජනතාව අතර ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව
(iv) මෙරට ග්‍රාම සංවර්ධනය උදෙසා ශ්‍රමදාන සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් ලද හැකි පිටු බලය
(v) සමාජ වෙබ් අඩවි මගින් ශ්‍රී ලංකාවේ තරුණ පරපුර කෙරෙහි ඇතිවන බලපෑම
(vi) විද්‍යුත් අධ්‍යාපන ක්‍රමයක් (E-Learning) මෙරටට හඳුන්වා දීමේ යෝග්‍යතාව

**මාර්ගෝපදේශනය**


වචන සංඛ්‍යාව 300-350 අතර වේ නම් හොඳ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් කරුණු ඒකරාශීකරණය
(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිවැරදි අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම
(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
(viii) කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
(ix) විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)


(ලකුණු 25 යි.)

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද එයට පිළිතුරු සපයා ඇත්තේ 92%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 6 ප්‍රාන්තරයේ 2%ක් ද,
ලකුණු 7 - 12 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 67%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 12%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 12%ක් වන අතර 21%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 12ට අඩුවෙනි.




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුවද පිළිතුරු සපයා ඇත්තේ 92%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ. දී ඇති රචනා මාතෘකා හයෙන් එකක් තෝරා ගෙන රචනයක් ලිවිය යුතුව තිබුණු අතර එයින් (i), (ii), (iii), (v) යන රචනා මාතෘකා හතර සඳහා 54%කට වැඩි පහසුතා මට්ටමක් පෙන්නුම් කර ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

අපේක්ෂකයන්ගේ පහසුතා මට්ටම මගින් ඉහළ තත්ත්වයක් ගෙන ඇත්තේ (iii) වන රචනා මාතෘකාවයි. අනතුරුව (i), (ii) හා (v) මාතෘකා ද අපේක්ෂකයන්ගේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතින ආකාරයක් නිරූපණය කරයි. එහෙත් (iv) හා (vi) යන මාතෘකා අඩු පහසුතා මට්ටම් දක්වන අතර එයින් (vi) මාතෘකාව අඩු ම පහසුතාවක් නිරූපණය කරයි. ඒ අනුව විද්‍යුත් අධ්‍යාපන ක්‍රමයක් පිළිබඳව දී ඇති මාතෘකාව (E-Learning) යටතේ කරුණු ගොනු කර ගැනීමට ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂකයින් තුළ නො තිබුණු බව දක්නට ලැබුණි.

**නිගමන හා යෝජනා**

මෙහි රචනා මාතෘකා සියල්ල සකස් වී ඇත්තේ සමාජයේ විවිධ පැතිකඩ පාදක කර ගෙන ය. එසේ ම මෙම මාතෘකා නූතන සමාජ තත්ත්වයන් පාදක කර ගෙන සකස් වී ඇත. විද්‍යුත් අධ්‍යාපන ක්‍රමය පිළිබඳ මාතෘකාව අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි මතු වූ නව ප්‍රවණතාවකි. මෙබඳු කරුණු කෙරෙහි අපේක්ෂකයන්ගේ වැඩි අවධානයක් යොමු කරවීම අවශ්‍ය වන අතර ඒ ආශ්‍රිත ව රචනා ලිවීමට ද ඔවුන් පුරුදු කරවීම වැදගත් කරුණකි. ඊට අමතර ව සඟරා, ප්‍රවෘත්ති පත්‍ර කියවීමටත් විද්‍යුත් මාධ්‍ය, ප්‍රවෘත්තිවලට සවන් දීමටත් අපේක්ෂකයන් යොමු කරවීම අවශ්‍ය ය.

## 04 ප්‍රශ්නය

4\. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) නගරයෙහි ළමයි සඳහා වෙන් කරන ලද එළිමහන් උද්‍යානයක් ඇත.
(ii) මම ගුණපාල නම් කම්කරුවෙක් වෙමි.
(iii) දෝන ඉසබෙලා නොහොත් ගජමන් නෝනා ප්‍රකට කිවිඳියක් වූවා ය.
(iv) ප්‍රකට නවකතාකරුවකු වූ මාර්ටින් වික්‍රමසිංහ දක්ෂ කෙටිකතාකරුවකු ද වෙයි.
(v) නායකයන් නිසි මග දක්වති'යි මිනිසුන් සිතති.

**පිළිතුරු**

(i) නගරයෙහි ළමයින් සඳහා වෙන් කරන ලද එළිමහන් උද්‍යානයක් ඇත.
(ii) නිවැරදි වාක්‍යයකි.
(iii) දෝන ඉසබෙලා හෙවත් ගජමන් නෝනා ප්‍රකට කිවිඳියක් වූවා ය.
(iv) ප්‍රකට නවකතාකරුවකු වූ මාර්ටින් වික්‍රමසිංහ දක්ෂ කෙටිකතාකරුවෙක් ද වෙයි.
(v) නායකයන් නිසි මග දක්වති'යි මිනිස්සු සිතති.

(ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) මුත්තණුවෝ අරණ්‍යයේ දී තාපසයන් වහන්සේ වැන්දහ.
(ii) වැද්දා ගිරවා ද කුඩුව ද වළට පෙරළා දමයි.
(iii) ඕ තොමෝ තියුණු ස්වරයෙන් කිසිවකු ඇමතුවා ය.
(iv) රාජ්‍ය නායකයෝ සම්මන්ත්‍රණ ශාලාවේ දී තොප පැසසූහ.
(v) රජවරු වහලුන් ලවා බලෙන් වැව් සාදවති.

**පිළිතුරු**

(i) මුත්තණුවන් විසින් අරණ්‍යයේ දී තාපසයන් වහන්සේ වඳින ලද සේක/වඳින ලදහ/වඳින ලද්දාහ/වඳිනු ලැබූහ/වඳිනු ලැබුවෝ ය/වඳිනු ලැබුවාහ/වඳිනු ලැබූ/වැඳුණහ/වැඳුණෝ ය/වැඳුණාහ/වැඳුණු.
(ii) වැද්දා විසින් ගිරවා ද කුඩුව ද වළට පෙරළා දැමෙති/දැමෙත්/දමනු ලබති/දමනු ලැබෙති/දමනු ලබත්/දමනු ලැබෙත්.
(iii) ඇය විසින් තියුණු ස්වරයෙන් කිසිවෙක් ඇමතුණු/ඇමතුණහ/ඇමතුණාහ/ඇමතුණෝ ය/අමතන ලදහ/අමතන ලද්දාහ/අමතන ලදු/අමතන ලද්දෝ ය/අමතනු ලැබූහ/අමතනු ලැබුවෝ ය/අමතනු ලැබුවාහ/අමතනු ලැබූ.
(iv) රාජ්‍ය නායකයන් විසින් සම්මන්ත්‍රණ ශාලාවේ දී තොපි පැසසුණෙහු/පැසසුණහු/පැසසුණුහු/පසසන ලද්දෙහු/පසසන ලදහු/පසසනු ලැබූහු/පසසනු ලැබුවෙහු/පසසනු ලැබුණෙහු.
(v) රජවරුන් විසින් වහලුන් ලවා බලෙන් වැව් සැදවෙයි/සැදවේ/සාදවනු ලැබෙයි/සාදවනු ලබයි/සාදවනු ලැබේ.

(ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වාක්‍යයක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.


(i) කෙනෙක් (වැනසෙයි/වැනසෙති) හැනී හුල්වල
(ii) ඔවුහු (මා/මාව) පීඩනයට ලක් කරති.
(iii) පර සතුරන් (එති එති/එයි එයි) යන බසටා
(iv) මේ සම්භාවනීය ආරාධිත අමුත්තෝ මා විසින් පිළිගනු (ලබමි/ලැබෙති).
(v) ජාත්‍යන්තර සමුළුවට රාජ්‍ය (නායකයන්/නායකයෝ) පැමිණ නැත.

**පිළිතුරු**


(i) වැනසෙති
(ii) මා
(iii) එති එති
(iv) ලැබෙති
(v) නායකයන්

(ලකුණු 05 යි.)

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 44%
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 10%ක් වන අතර 50%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය කොටස් තුනකින් ද, අනුකොටස් 15කින් ද යුක්ත වේ. එයින් පහසුතාව 60%කට වඩා ලබා ගත් අනුකොටස් 6ක් ද 66% අඩු පහසුතාව දක්වන අනුකොටස් 4ක් ද පෙන්නුම් කරයි.

**(අ) කොටසෙහි නිරීක්ෂණ**

4වන ප්‍රශ්නයේ (අ) කොටසෙහි (i) වන අනුකොටසෙහි පහසුතා මට්ටම 80%ක් වේ. ඉන් පෙනෙන්නේ පහසුතා මට්ටම අතින් ඉහළ ස්වරූපයකි. (ii) වන අනුකොටසෙහි පහසුතා මට්ටම 45%කි. (iii) වන අනුකොටසෙහි පහසුතා මට්ටම 8%කි. (iv) වන අනුකොටසෙහි පහසුතා මට්ටම 46%කි. (v) වන අනුකොටසෙහි පහසුතා මට්ටම 56%කි. මේ අනුව පහසුතා මට්ටමෙහි අනුපිළිවෙළ වන්නේ (i), (v), (iv), (ii) හා (iii) යි.

(iii) වන අනුකොටසෙහි ඇත්තේ නිපාත භාවිතයට අදාළ ප්‍රශ්නයකි. එනම් “නොහොත්” නිපාත භාවිතය යි. මෙහි දී ගජමන් නෝනා සඳහා දෝන ඉසබෙලා යන්න භාවිත වන බව බොහෝ අපේක්ෂකයන් දැන නො සිටීම නිසා ඔවුනගේ පහසුතා මට්ටම දුර්වල තත්ත්වයක පැවතිණි.

පහසුතා මට්ටම අතින් ඉහළ මට්ටමක පැවතියේ (i) වන අනුකොටසයි. එහි නිපාත පදයක් සමග උක්ත නාමයක් යෙදීමේ සාවද්‍යතාව හඳුනා ගත යුතු ව තිබිණි. එය පහසුවෙන් හඳුනා ගෙන නිවැරදි කිරීමට ඇතැම් අපේක්ෂකයන් සමත් ව ඇත. එහෙත් අනෙක් ප්‍රශ්නවල සදොස් තැන් හඳුනා ගැනීමේ දී පෙනෙන සංකීර්ණ ස්වරූපයක් නිසා පහසුතා මට්ටම් ක්‍රමයෙන් අඩු වී යන බවකි.

**නිගමන හා යෝජනා**

සිංහල ව්‍යාකරණයෙහි විවිධ පැතිකඩ ඔස්සේ වාක්‍ය සම්පාදනය කිරීමේ දී මතුවන ගැටලු හා ඒවා නිරාකරණය කළ යුතු ආකාරය ගැන මනා අවබෝධයක් මෙන් ම පරිචයක් ද අපේක්ෂකයන්ට ලබා දීම අවශ්‍ය වේ. බහුල ව යෙදෙන සාවද්‍ය ස්ථාන හඳුනා ගැනීමට මෙන් ම එතරම් පහසුවෙන් හඳුනා ගත නො හැකි සාවද්‍ය තැන් තේරුම් ගැනීමට ද අපේක්ෂකයන් පුහුණු කර විය යුතුය.

**(ආ) කොටසෙහි නිරීක්ෂණ**

හතරවන ප්‍රශ්නයේ (ආ) කොටසෙහි (i) වන අනුකොටසෙහි පහසුතාව 39%ක් වේ. (ii) වන අනුකොටසෙහි පහසුතාව 22%කි. (iii) වන අනුකොටසෙහි පහසුතාව 21%කි. (iv) වන අනුකොටසෙහි පහසුතාව 33%කි. (v) වන අනුකොටසෙහි පහසුතාව 27%කි. මේ අනුව පහසුතා මට්ටම්වල අනුපිළිවෙළ දැක්වෙන්නේ (i), (iv), (v), (ii) හා (iii) වශයෙනි. මෙම කොටසෙහි පහසුතා මට්ටම පහළ තත්ත්වයක පැවතිණ.

පහසුතා මට්ටම අතින් ඉතා දුර්වල තත්ත්වයක පැවතියේ (iii) වන අනුකොටසයි. එහි ඇතුළත් වූයේ "ඕ තොමෝ" යන කර්තෘ ඇතුළත් වාක්‍යය කර්ම කාරකයට හැරවීමේ දී ගනු ලබන රූපය තෝරා ගැනීමේ දුෂ්කරතාවයි. ඒ සඳහා "ඇය" යන්න තෝරා ගැනීමට බොහෝ අපේක්ෂකයන් අසමත් වූ බව පෙනේ. (ii) වන අනුකොටසෙහි දැක්වෙන ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම දෙකක් කර්ම කාරකයට හැරවීමේ දී එහි ක්‍රියාව කවර වචනයෙන් තිබිය යුතු ද යන්න බොහෝ අපේක්ෂකයන් නො දැන සිටි බව පෙනේ.

අපේක්ෂකයන්ට තරමක් හෝ පහසු වූයේ පළමුවන අනුකොටසයි. එහි "මුත්තණුවෝ" යන්න "මුත්තණුවන්" ලෙසින් සකස් කිරීමටත්, උක්ත රූපය හඳුනා ගෙන ආඛ්‍යාතය නිවැරදි ව සැකසීමටත් ඔවුන් සමත් වී තිබිණි. සමස්තයක් ලෙස සැලකීමේ දී කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හැරවීම ගැන එතරම් පරිචයක් අපේක්ෂකයින් තුළ නොවූ බව පෙනේ.

**නිගමන හා යෝජනා**

කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හැරවීම පිළිබඳ මනා අවබෝධයක් හා පරිචයක් අපේක්ෂකයන්ට ලබා දීම වැදගත් ය. විවිධ ස්වරූපයෙන් පවත්නා වාක්‍ය කර්මකාරකයට හැරවීම පිළිබඳ අවබෝධයක් ඔවුනට ලබා දීම අත්‍යවශ්‍ය වේ.

**(ඉ) කොටසෙහි නිරීක්ෂණ**

මෙහි සෑම අනුකොටසක ම පහසුතා මට්ටම සතුටුදායක ය. එහි (i) අනුකොටසෙහි පහසුතා මට්ටම 74%කි. (ii) අනුකොටසෙහි පහසුතා මට්ටම 83%කි. (iii) කොටසෙහි පහසුතා මට්ටම 61%කි. (iv) වන අනුකොටසෙහි පහසුතා මට්ටම 73%කි. (v) කොටසෙහි පහසුතා මට්ටම 75%කි. මේ අනුව පහසුතා මට්ටම් අනුපිළිවෙළ (ii), (v), (i), (iv) හා (iii) වශයෙනි.

මේ කොටසෙහි වරහන් තුළ දී ඇති පද දෙක අතුරෙන් නිරවද්‍ය පදය තෝරා ගැනීමට අපේක්ෂකයින්ට උපදෙස් ලැබී තිබුණි. මෙහි දී අපේක්ෂකයින්ගේ අවබෝධය සහ විශ්ලේෂණ ශක්තිය පිරික්සීමක් ද සිදු වේ. වාක්‍යයට යෝග්‍ය පදය තෝරා ගැනීම කළ යුතුව තිබිණි. මේ අනුකොටස් අතර මධ්‍යස්ථ පහසුතා මට්ටමක පැවතියේ තෙවැන්නයි. එය සංශයාර්ථය සහිත වාක්‍යයක ක්‍රියා පදය යෙදීම ආශ්‍රිත ව සිදු වූවකි. අපේක්ෂකයන් පහසුතා මට්ටම අතින් ඉහළ තත්ත්වයක් පෙන්වා ඇත්තේ (ii)වන අනුකොටසට ය.

**නිගමන හා යෝජනා**

වාක්‍යයක කර්තෘ, කර්ම හා ක්‍රියා පද යෙදීම පිළිබඳ ව මනා පරිචයක් අපේක්ෂකයන්ට ලබා දීම වැදගත් ය. ඒ අනුව විවිධාකාරයේ වාක්‍යවල මෙම කොටස් යෙදෙන ආකාරය සම්බන්ධ අභ්‍යාසවල යෙදවීම අවශ්‍ය ය.

**සමස්ත නිගමන හා යෝජනා**

මෙම ප්‍රශ්නයේ (අ), (ආ) හා (ඉ) කොටස් තුන ම ව්‍යාකරණය පාදක කොටගෙන ඉදිරිපත් වූ බව පෙනේ. වාක්‍යය නිවැරදි කිරීම, කර්ම කාරකයට හැරවීම, නිවැරදි ව කර්තෘ, කර්ම හා ක්‍රියා පදය යෙදීම ආශ්‍රිත ව මේ ප්‍රශ්නය සකස් වී තිබේ. මෙයින් පැහැදිලි වන්නේ ව්‍යාකරණයට අදාළ විවිධ පැතිකඩ ඔස්සේ වාක්‍යවල සදොස් තැන් හඳුනා ගැනීමත්, ඒවා නිදොස් කිරීමත් කෙරෙහි අපේක්ෂක අවධානය යොමු කළ යුතු බවයි.

## 05 ප්‍රශ්නය

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

   (i) සමාජ අසාධාරණය නිසා සමහරු **අපේක්ෂාභංගයට** පත් වෙති.
   (ii) **ලලනාධිපත්‍ය** සංකල්පය ද සමාජ ප්‍රගතියට අහිතකර ය.
   (iii) ඇතැම්හු **පරවාදඛණ්ඩනයට** පමණක් උත්සුක වෙති.

**පිළිතුරු**

(i) කැමති අදහස ඉටු නොවී විනාශවීමට/බලාපොරොත්තු කඩවීමට/බලාපොරොත්තු සුන්වීමට
(ii) කාන්තාවන්/ස්ත්‍රීන්, ආධිපතිත්වයට/ප්‍රධානත්වයට/මූලිකත්වයට පත්වීම
(iii) අනුන්ගේ මත/අදහස්, ඛණ්ඩනය කිරීමට/කැඩීමට/බිඳීමට

(ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

   (i) තමා උසස් සේ සැලකීම
   (ii) දත් හා තොල් ආශ්‍රය කොටගෙන හටගන්නා (අක්ෂර)
   (iii) රාත්‍රියෙහි සැරි සරන

**පිළිතුරු**

(i) අත්තුක්කංසන
(ii) දන්තෞෂ්ඨ්‍යජ/(දන්තෝෂ්ඨ්‍යජ, දන්තෝට්ඨ්‍යජ)
(iii) නිශාචර/නිසාචර

(ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

   (i) ධාවන ............................ මේරියන් ජෝන්ස් ලෝකප්‍රකට තැනැත්තියකි.
   (ii) අන්‍යයන්ගේ වැරදි දෙස බලන විට ඔහුගෙන් සිදු වූ වරද ඉතා ............................ ය.
   (iii) සුරා ධූර්තයෝ ............................ ශාලාවට ප්‍රවිෂ්ට වූ හ.
   (iv) උපාධි ප්‍රදානෝත්සවයේ දී එක් ශිෂ්‍යයෙක් කලා ............................ උපාධිය හිමි කර ගත්තේ ය.
   (v) පාරිභෝගිකයෝ උත්සව සමයෙහි ............................ශාලාවලින් ආහාර පාන ගනිති.
   (vi) මේ මාර්ගය ලිස්සන ............................ය.

   (සුලු/ සුළු/ ආපාන/ ආපණ/ සූරී/ ශූරී)

**පිළිතුරු**

(i) ශූරී
(ii) සුළු
(iii) ආපාන
(iv) සූරී
(v) ආපණ
(vi) සුලු

(ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.


   (i) ගොවියා **වස** පානය කොට මිය ගියේ ය.
   (ii) ඔහුගේ මුවින් පිට වූ **වදන** සිතට වේදනා ගෙන දෙන්නකි.
   (iii) **පිය** සෙනෙහස ද මව් සෙනෙහස මෙන් ම අගනේ ය.
   (iv) වැවෙහි **දිය** දහර කෙත්බිම් සරු කෙළේ ය.
   (v) **පල** නොකියා පලා බෙදනවා වගෙයි.
   (vi) **අදර** විබත යන්න ම ආධාර විභක්ති යන නාමයෙන් ද හැඳින්වේ.

**පිළිතුරු**

(i) වස (විෂ) වර්ෂය, වර්චස්, ජලය, වස්කාලය, නපුරු, වාසය, විසීම, වාසස්ථානය
(ii) වදන (වචනය) මුඛය, මුහුණ, පිවිසීම, ප්‍රසව කරන
(iii) පිය (පියා) පාදය, ප්‍රිය, වල්ලභයා, ප්‍රියාව, කාන්තාව, ප්‍රියභාවය, ප්‍රීතිය, පියාපත, ඇසිපිය, පිහිට
(iv) දිය (ජලය) ජය, දුනුදිය, ලෝකය, විධික්‍රියාර්ථය
(v) පල (යන්න) ගෙඩිය, විපාකය, වහල, ස්ථානය
(vi) අදර (ආධාර) තොල, ආදරය


(ලකුණු 06 යි.)

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 29%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 9%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 9%ක් වන අතර 49%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය කොටස් හතරකින් හා අනුකොටස් 18කින් යුක්ත වේ. එයින් පහසුතාව 70%කට වඩා ලබා ගත් අනුකොටස් 5ක් ද, 16%ට අඩු පහසුතාව දක්වන අනුකොටස් 3ක් ද පෙන්නුම් කරයි.

**(අ) කොටසෙහි නිරීක්ෂණ**

(අ) කොටසෙහි අනුකොටස් තුනක් ඇතුළත් වේ. මේ අනුකොටස් අර්ථ විග්‍රහ කොට බැලීම පාදක කොටගෙන ඇත. මේ තෝරා ගෙන ඇති වචන සම්භාව්‍ය සාහිත්‍යයේ දක්නට ඇති රූපයි. මෙහි (i) වන අනුකොටසේ පහසුතාව 61%කි. (ii) වන අනුකොටසේ පහසුතාව 46%කි. (iii) වන අනුකොටසේ පහසුතාව 15%කි. මේ කොටසේ පහසුතා මට්ටම පිළිවෙළින් (i), (ii), හා (iii) ලෙස දැක්විය හැකි ය.

පහසුතා මට්ටම අතින් දුර්වල තත්ත්වයක වූයේ (iii) අනුකොටසයි. මෙහිදී "පරවාදඛණ්ඩනයට" යන්න අපේක්ෂකයින් අවබෝධ කොටගත යුතු ව තිබිණි. එය නිතර ම භාවිතයේ නො යෙදී ම නිසා අපේක්ෂකයින්ට දුරවබෝධ වූවා විය හැකි ය. මේ අතර පහසුතා මට්ටම අතින් ඉහළ මට්ටමක පැවතියේ "අපේක්ෂාභංගයට" යන්නයි. එය නිතර භාවිතයේ යෙදෙන පදයක් වීම නිසා අපේක්ෂකයින්ට පහසුවෙන් වටහා ගත හැකි වූ බව පෙනේ.

**නිගමන හා යෝජනා**

සම්භාව්‍ය සාහිත්‍යයේ යෙදෙන මිශ්‍ර සිංහල වචන ගැන අවබෝධයක් අපේක්ෂකයින් තුළ ඇති කිරීම අත්‍යවශ්‍ය වූවක් බව කිව යුතු ය.

**(ආ) කොටසෙහි නිරීක්ෂණ**

(ආ) කොටස යටතේ අනුකොටස් තුනක් ඇතුළත් වේ. (i) හි පහසුතා මට්ටම 5%කි. (ii) අනුකොටසේ පහසුතා මට්ටම 15%කි. (iii) අනුකොටසේ පහසුතා මට්ටම 93%කි. මේ අනුව පහසුතා මට්ටමෙහි අනුපිළිවෙළ වන්නේ (iii), (ii) හා (i) වශයෙනි.

මේ කොටසෙහි යෙදුම් සඳහා තනි පද ඉදිරිපත් කිරීම කළ යුතුව තිබිණි. ඉන් පහසුතා මට්ටම දුර්වලව පැවතියේ (i) අනුකොටසට ය. එයට යෝග්‍ය තනි පදය "අත්තුක්කංසන" යන්නයි. මෙය බොහෝ අපේක්ෂකයින්ට ගැටලුවක් වන්නට ඇත. එහෙත් (iii) වන අනුකොටසෙහි "රාත්‍රියෙහි සැරි සරන" යන්නට යෝග්‍ය තනි පදය "නිශාචර" යන්න දැන සිටි බව පෙනේ. එසේම (ii) අනුකොටසෙහි ඇති දත් හා තොල් ආශ්‍රය කර ගන්නා අක්ෂර "දන්තෞෂ්ඨ්‍යජ" බව අපේක්ෂකයින් වැඩි දෙනෙක් නො දැන සිටි බව පැහැදිලි වේ.

**නිගමන හා යෝජනා**

විවිධ යෙදුම් සඳහා යෝග්‍ය තනි පද පිළිබඳ මනා අවබෝධයක් හා පරිචයක් අපේක්ෂකයින්ට ලබා දීම මෙහි දී අත්‍යවශ්‍ය වේ.

**(ඉ) කොටසෙහි නිරීක්ෂණ**

(ඉ) කොටසෙහි අනුකොටස් හයක් ඇතුළත් වේ. අනුකොටස් අංක (i) හි පහසුතා මට්ටම 79%කි. (ii) හි පහසුතා මට්ටම 75%කි. (iii) හි පහසුතා මට්ටම 59%කි. (iv) හි පහසුතා මට්ටම 73%කි. (v)හි පහසුතා මට්ටම 58%කි. (vi) හි පහසුතා මට්ටම 71%කි. මේ අනුව පහසුතා මට්ටම්වල අනුපිළිවෙළ වනුයේ, (i), (ii), (iv), (vi), (iii) සහ (v) වශයෙනි.

මෙම කොටසෙහි අරමුණ වූයේ හිස්තැන්වලට යෝග්‍ය පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලිවීමයි. මෙහි දී යෝග්‍ය පද තෝරා ගැනීමේ දී අපේක්ෂකයන් තුළ පැවති අවබෝධය සහ පරිචය පරීක්ෂා කෙරේ. අපේක්ෂකයින්ගේ පහසුතා මට්ටම අතින් දුර්වල මට්ටමක පැවතියේ (v) වන අනුකොටස යි. එහි යෝග්‍ය පදය වූයේ "ආපණ" යන්නයි. එසේ ම (iii) අනුකොටස ද අපේක්ෂකයන්ට අපහසු වී තිබිණි. එහි යෝග්‍ය පදය වූයේ "ආපාන" යන්නයි. (i) වන අනුකොටසෙහි "ශූරී" යන්න හිස්තැනට සුදුසු වචනය ලෙස ගළපා ගැනීමට බොහෝ අපේක්ෂකයන් සමත් ව තිබේ.

**නිගමන හා යෝජනා**

සමස්තයක් ලෙස පෙනෙන්නේ කිසියම් වාක්‍යයක හිස්තැනට යෝග්‍ය පදය කුමක් ද' යි හඳුනා ගැනීමට අපේක්ෂකයන් දක්වන පහසුතා මට්ටම ඉහළ තත්ත්වයක නොපැවතීම යි. ඒ අනුව වාක්‍යවල විවිධ පරිසරයන්හි යෙදෙන වචන හා ඒවායේ යෝග්‍ය හෝ අයෝග්‍යතාව ගැන අවබෝධය අපේක්ෂකයන් තුළ ඇති කළ යුතුය.

**(ඊ) කොටසෙහි නිරීක්ෂණ**

(ඊ) කොටස යටතේ අනුකොටස් 6කි. මෙහි අනුකොටස් (i) හි පහසුතාව 46%කි. (ii) හි 52%කි. (iii) හි 55%කි. (iv) හි 42%කි. (v) හි 51%කි. (vi) හි 51%කි. මේ අනුව පිළිවෙළින් අනුකොටස්වල පහසුතා මට්ටම වන්නේ, (iii), (ii), (v), (vi), (i) සහ (iv) වශයෙනි.

මේ කොටසෙහි අරමුණ වූයේ බහු අර්ථ පද යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් සම්පාදනය කිරීමයි. පහසුතා මට්ටම අතින් දුර්වල වූයේ (iv) කොටසයි. එහි "දිය දහර" යන්නෙහි "දිය" යන පදයේ විවිධ අර්ථ පිළිබඳ පුළුල් දැනුමක් අපේක්ෂකයන් තුළ නො වීය. (iii) කොටසෙහි "පිය සෙනෙහස" හි "පිය" යන්න පිළිබඳ අපේක්ෂකයන් තුළ අවබෝධය සතුටුදායක විය. සමස්තයක් ලෙස සැලකීමේ දී මේ අනුව පෙනෙන්නේ බහු අර්ථ පද යෙදෙන විවිධ අරුත් ගැන අපේක්ෂකයන් තුළ පුළුල් අවබෝධයක් නොමැති බවයි. එසේ ම මෙහි දී නිවැරදි වාක්‍ය රීති අනුගමනය නො කිරීම ද ලකුණු නො ලැබීමට හේතුවක් වී තිබිණි.

**නිගමන හා යෝජනා**

බහු අර්ථ පදවල විවිධ අරුත් මෙන් ම ඒවා යෙදෙන පරිසර පිළිබඳ මනා අවබෝධයක් ද, නිවැරදි වාක්‍ය රීති පිළිබඳ අවබෝධයක් ද අපේක්ෂකයන් තුළ ඇති කිරීම මෙහි දී ඉතා වැදගත් බව සඳහන් කළ යුතු ය.

**සමස්ත නිගමන හා යෝජනා**

5වන ප්‍රශ්නය සමන්විත වී ඇත්තේ වචන කෝෂයේ විවිධ පැතිකඩ පාදක කර ගෙන ය. ඉන් පෙනෙන්නේ විවිධ අංශ ඔස්සේ වචන කෝෂය විග්‍රහ කොට බැලිය හැකි බවයි. මේ අනුව වචන කෝෂයෙහි විවිධ පැතිකඩ ගැන පුළුල් දැනුමක් අපේක්ෂකයන් ලබා ගත යුතු බව අවධාරණයෙන් ම සඳහන් කළ යුතු ය.

## 06 ප්‍රශ්නය

6. තද කළු අකුරෙන් දී ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට හා අනුඅංගයකට අයත් දැයි දක්වන්න.

(i) **කම්කරුවා** **වනයේදී** **මංමුළා** වූ ගවයකු ඇල්ලී ය.

(ii) චක්‍රවර්ති **රාජේන්ද්‍රයා** **මනුලොවට** **අග්‍රතම** වෙයි.

(iii) **සොරමුළ** **රන්රිදී** අබරණ ගෙන **තාප්පයෙන්** පැන පලා ගියහ.

(iv) **මළ** මිනිසකු දුටු ආරක්ෂකයා **වහ-වහා** **ග්‍රාමසේවක** කාර්යාලයට දිවී ය.

(v) **නිර්දෝෂී** සිසුන් සිරගෙට **දැම්මොත්** අපි **හෙට** සටනට බහින්නෙමු.


පිළිතුර

| | අංගය | අනුඅංගය |
|---|---|---|
| (i) කම්කරුවා | සමාස<br>විභක්ති | කම් විබත් සමස්/කර්ම විභක්ති සමාසය<br>ප්‍රථමා විභක්තිය/පෙර විබත |
| වනයේදී | විභක්ති | ආධාර විභක්තිය/අදර විබත් |
| මංමුළා | සන්ධි | ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය |
| (ii) රාජේන්ද්‍රයා | සන්ධි<br>විභක්ති | ස්වරාදේශ/ගුණ සන්ධිය<br>ප්‍රථමා විභක්තිය/පෙර විබත |
| මනුලොවට | සමාස<br>විභක්ති | (සබඳ) විබත් සමස්/(සම්බන්ධ) විභක්ති සමාසය/<br>ආධාර විභක්ති අර්ථය |
| අග්‍රතම | තද්ධිත | තම ප්‍රත්‍යයය/උත්කෘෂ්ටාර්ථය/වඩාත් ම යන<br>අර්ථය |
| (iii) සොරමුළ | සමාස<br>විභක්ති<br>සමූහාර්ථ | (සබඳ) විබත් සමස්/ (සම්බන්ධ) විභක්ති සමාසය<br>ප්‍රථමා විභක්තිය<br>ප්‍රාණවාචීත්වය |
| රන්රිදී | සමාස | ද අරුත් සමස්/දකාරාර්ථ සමාසය |
| තාප්පයෙන් | විභක්ති | අවදි විබත්/අවධි විභක්තිය |
| (iv) මළ | කෘදන්ත | අතීත කෘදන්ත |
| වහ-වහා | නිපාත<br>විශේෂණ | ශීඝ්‍රාර්ථයේ නිපාත<br>ක්‍රියා විශේෂණ |
| ග්‍රාම සේවක | සමාස | අදර විබත් සමස්/ආධාර විභක්ති සමාසය |
| (v) නිර්දෝෂී | සමාස<br>උපසර්ග | අවිය සමස්/අව්‍යය සමාසය<br>නිෂේධාර්ථය |
| දැම්මොත් | ක්‍රියා | අනියමාර්ථයේ අසම්භාව්‍ය/<br>ක්‍රියා නිපාත/නෛපාතික ක්‍රියා |
| හෙට | නිපාත | කාලාර්ථය |


(ලකුණු 3 X 5 = 15 යි.)

- ව්‍යාකරණ අංගය හා අනුඅංගය යන දෙකින් ව්‍යාකරණ අංගය පමණක් නිවැරදි ව දක්වා ඇතත් සම්පූර්ණ ලකුණු හිමි වේ.

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 34%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 2%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 44%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 40%ක් වන අතර 16%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




6 වන ප්‍රශ්නයේ කොටස් අතුරෙන් 84%ක පහසුතාවක් පෙන්නුම් කෙරෙනුයේ (v) වන අනුකොටසට ය. (ii) හා (iii) කොටස් ද පිළිවෙළින් 82%ක හා 81%ක පහසුතා පෙන්නුම් කරයි. අඩු ම පහසුතාවක් දක්වනුයේ (iv) වන අනුකොටස වන අතර එය 48%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

6 වන ප්‍රශ්නයෙහි (i) අනුකොටසෙහි පහසුතා මට්ටම 63%ක් ද (ii) අනුකොටසෙහි පහසුතා මට්ටම 82%ක් ද, (iii) අනුකොටසෙහි පහසුතා මට්ටම 81%ක් ද (iv) අනුකොටසෙහි පහසුතා මට්ටම 48%ක් ද, (v) අනුකොටසෙහි පහසුතා මට්ටම 84%ක් ද වේ. මේ අනුව පහසුතා මට්ටමෙහි අඩුවන අනුපිළිවෙළ වන්නේ (v), (ii), (iii), (i) හා (iv) යි. (iv) අනුකොටසෙහි අවධානය යොමුවන්නේ ව්‍යාකරණයට අදාළ අංග හතරක් වන කෘදන්ත, නිපාත, විශේෂණ හා සමාස ආශ්‍රිත ව පවත්නා වචන ගැන යි. මෙහි දී 'මළ', 'වහ වහා', 'ග්‍රාමසේවක' යන පදවල ප්‍රධාන අංගය ඇතැම් අපේක්ෂකයින් හඳුනා ගෙන ඇතත් අනුඅංග දැක්වීමේ දී අපේක්ෂකයන් දුෂ්කරතාවලට මුහුණ පා ඇත. ප්‍රධාන අංගය ද නිවැරදි ව දැක්වීමට අපේක්ෂකයන් බහුතරයක් අසමත් ව ඇත. (v) වන අනුකොටස පහසුතා මට්ටම අතින් ඉහළ අගයක පවතියි. මෙහි වචන තුනක් ආශ්‍රය කොටගෙන ඒවා අයත් වන අංගය හා අනුඅංගය පිළිබඳව ප්‍රශ්න කෙරේ. එනම් නිර්දෝෂී, දැම්මොත්, හෙට යන වචනයි. අපේක්ෂකයන්ට මෙය පහසු මට්ටමක පැවතිණි. සෙසු අනුකොටස්වලට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පැවතිණි.

**නිගමන හා යෝජනා**

ව්‍යාකරණයට අදාළ කරුණු ආශ්‍රිත ව ඒවායේ අංග හා අනුඅංග පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන මෙම ප්‍රශ්නය අපේක්ෂකයන්ට නව්‍ය ස්වරූපයක් ගත් බව පෙනේ. බොහෝ විට අපේක්ෂකයන් මෙබඳු කරුණුවල දී අවධානය යොමු කරන්නේ ව්‍යාකරණ අංග ගැනයි. එහෙත් අනුඅංග ගැන ද ඔවුන්ගේ අවධානය යොමු විය යුතු බව මෙහි දී අවධානය යොමු කළ යුතු ය.

**07 ප්‍රශ්නය**

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) සුදුසු වෙලාවට ක්‍රියාත්මක වීම
(ii) අනාගතයේ සිදු විය හැකි දේ වර්තමානයේ සිට ම සැලසුම් කිරීම
(iii) එක කරදරයකින් මිදීම සඳහා තවත් කරදරයක පැටලීම
(iv) සත්පුරුෂයන් අතර අසත්පුරුෂයන් ද ගැවසීම
(v) ක්‍රියාවට නැංවිය නොහැකි දේ සැලසුම් කිරීම
(vi) තමන්ට උදව් කළ අය පසුව නොසලකා හැරීම

**පිළිතුරු**

(i) තැනේ හැටියට ඇණේ ගැසීම
අව්ව තිබෙන විට පිදුරු වේලා ගැනීම
තැටිය රත්වුණු විට රොටිය පුච්චා ගැනීම
(ii) මුහුද හත් ගව්වක් තියා අමුඩය ගැසීම
(iii) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ
කැහි ගැනි දී හොටු ගැනි ගත්තා වගේ
(iv) සඳුන් වනෙත් ඇත උරුලෑවෝ
(v) අහස් මාලිගා තැනීම
(vi) කන්ද නැග්ගාට පසු හැරමිටිය අතහැර දැමීම
වහළට නැග ඉනිමඟට පයින් ගැසීම

(ලකුණු 03 යි.)

(ආ) පහත දී ඇති **රූඪීවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) අංමදිනවා
(ii) අරඅඳිනවා
(iii) ඇඟේ ගහනවා
(iv) ඉබිගමන
(v) උප්පරවැට්ටිය
(vi) ඉවක් බවක් නැති ව

**පිළිතුරු**

(i) සටනට සූදානම් වීම
(ii) යමක් කිරීමට පෙර සූදානම
(iii) බලහත්කාරයෙන් යමක් පැවරීම/දීම
(iv) මන්දගාමී ලෙස කටයුතු කිරීම
(v) කූට ප්‍රයෝගය
(vi) සොයා බැලීමෙන් තොරව/අවිචාරවත් ව

(ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව කුමක් දැ**'යි දක්වන්න.

(i) අල්ලාප - සල්ලාප
(ii) කායික - මානසික
(iii) තරහ - මරහ
(iv) උසුළු - විසුළු
(v) පවුල් - පන්සල්
(vi) අත - මිට

**පිළිතුරු**

(i) අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම
(ii) එකිනෙකට වෙනස් අරුත් දනවන පද දෙකක් යෙදීම
(iii) පළමු පදය අර්ථවත් ව ද දෙවන පදය අර්ථ විරහිත ව ද යෙදීම
(iv) අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම
(v) අර්ථයෙන් එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම
(vi) අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම

(ලකුණු 03 යි.)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(i) ටැක්ගැහෙනවා (ii) ඇට්ටරකම
(iii) විජ්ජුම්බරය (iv) පෙළවහ
(v) මූකළාන (vi) සෝමාරියා

**පිළිතුරු**

(i) ප්‍රමාද වීම
(ii) අකීකරුකම/මුරණ්ඩු ගතිය
(iii) කරදරය/හිරිහැරය/ හානිය
(iv) විවාහය
(v) මහ කැළෑව/ගන කැළෑව
(vi) කම්මැලියා/අලසයා/උදාසීන පුද්ගලයා

(ලකුණු 03 යි.)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.


(i) පන්නකාරයා (ii) ආරනූල
(iii) වටමළුව (iv) කොට්ටෝරුවා
(v) දියලබ්බ (vi) අත්තම

**පිළිතුරු**


(i) ධීවරයා/මසුන් මරන්නා
(ii) මැණික් විශේෂයක්
(iii) වෘත්තාකාර ලෙස ගොයම් තැන්පත් කිරීම
(iv) ශාන්ති කර්මවල දී අත් උදව් දෙන්නා
(v) වතුර ගෙන යන ලබු කැටය
(vi) අන්‍යෝන්‍ය ශ්‍රම හුවමාරුව

(ලකුණු 03 යි.)

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 7%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 23%ක් වන අතර 46%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




7 වන ප්‍රශ්නයේ අනුකොටස් අතුරෙන් 53%ක වැඩිම පහසුතාව (ඊ) කොටස සඳහා දක්නට ලැබෙන අතර අඩුම පහසුතාවක් පෙන්නුම් කරනුයේ 26%ක් ලැබී ඇති (උ) කොටස ය.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

7 වන ප්‍රශ්නයේ කොටස් අතුරෙන් (අ) කොටස සඳහා පහසුතාව 36%ක් ද, (ආ) කොටස සඳහා පහසුතාව 49%ක් ද, (ඉ) කොටස සඳහා පහසුතාව 29%ක් ද, (ඊ) කොටස සඳහා පහසුතාව 53%ක් ද, (උ) කොටස සඳහා පහසුතාව 26%ක් ද වශයෙන් දැක්විය හැකි ය. මේ අනුව පහසුතා මට්ටමෙහි අඩුවන අනුපිළිවෙළ වන්නේ (ඊ), (ආ), (අ), (ඉ) හා (උ) ය. මෙම ප්‍රශ්නයේ කොටස් අතුරෙන් පහසුතා මට්ටමින් ඉහළ තත්ත්වයක පැවතියේ (ඊ) කොටසයි. අවම පහසුතා මට්ටමක පැවතියේ (උ) කොටසයි. අනෙක් කොටස් සඳහා සැපයූ පිළිතුරුවල පහසුතා මට්ටම් මධ්‍යස්ථ ස්වරූපයක පැවතිණි. (ඊ) කොටසින් අපේක්ෂකයන්ගේ අවධානයට යොමුකර ඇත්තේ ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පදයි. මෙම පද පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් අපේක්ෂකයන් තුළ පැවති බවක් නො පෙනේ.

(උ) කොටසට පාදක වූයේ ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ය. මෙම පද සමාජයේ විවිධ කර්මාන්ත හා ජීවන වෘත්තීන් ආශ්‍රිත ව සකස් වී ඇත. මෙබඳු පද ගැන අපේක්ෂකයන් තුළ පැවති දැනුම අල්ප වූ හෙයින් පහසුතා මට්ටම පහළ අගයක් ගත් බව පෙනේ. (උ) කොටසට වඩා පහසුතා මට්ටම අතින් ඉහළ ස්ථානයක් ගන්නේ (ඉ) කොටසට සැපයූ පිළිතුරු ය. එය යුගල පද යෙදී ඇති රටාව ආශ්‍රිත ව ඉදිරිපත් වූවකි. මේ පිළිබඳ ව සැපයූ පිළිතුරුවල ද පහසුතා මට්ටමෙහි ඉහළ අගයක් නො පෙනේ. අනතුරුව (අ) කොටසට සැපයූ පිළිතුරු පහසුතා මට්ටමෙන් ඉහළ ස්වරූපයක් ගෙන නැත. මෙම අනුකොටස ප්‍රස්තාව පිරුළු ආශ්‍රිත ව ඉදිරිපත් කර තිබිණි. මෙම අනුකොටස් හතර ම 50% සීමාව ඉක්මවන බවක් නො පෙනේ. 50% සීමාව ඉක්මවන්නේ (ඉ) කොටසට සපයා ඇති පිළිතුරු ය.

**නිගමන හා යෝජනා**

ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පදවල අරුත් පිළිබඳ ව මෙන් ම යුගල පද සැදෙන රටා පිළිබඳවත්, ප්‍රස්තාව පිරුළු පිළිබඳවත් සැපයූ පිළිතුරුවල පැවති දුර්වලතා හා පහසුතා මට්ටම්වලින් පෙනී යන්නේ ඒවා ගැන නිරවුල් දැනුමක් අපේක්ෂකයන් තුළ නොමැති වූ බවයි. එබැවින් යථෝක්ත අංශ පිළිබඳ ව මනා අවබෝධයක් ඇති කර ගැනීම මෙන් ම භාවිතය කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු විය යුතු ය.

## 08 ප්‍රශ්නය

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුරයේප්‍රථමරාජධානියේමහමෙව්නාඋද්‍යානයමධ්‍යයෙහිසිසිල්සෙවණින්සුසැදිකොළතරපක්ෂීන් ගැවසිඅතුපතරවිහිදීමනරම්රන්තෙළඹුවෘක්ෂයක්වියඑයටඅධිගෘහිතවස්වර්ණමාලීනම්දෙව්දුවක්විසුවායඇරූමත්ය සිරිමත්යපැහැපත්යබුව382 486කාලයෙහිරජකළදුටුගැමුණුරජතුමාමේරන්තෙළඹුවස්වර්ණමාලියගේවාසභවනයකපාඑතැන චෛත්‍යයක්ඉදිකිරීමටසිතීයඑයකැපීමටසැරසෙත්මඅනේමටවුණුවිපතඅනේමටවුණුවිපතකියමින්ඇහඬාවැලපෙන්නටවූවාය රජතුමාඑහිගොස්ස්වර්ණමාලියෙනිකුමක්නිසාවැලපෙන්නෙහිදැයිවිචාළේයමාගේවාසභවනයවිනාශකරනනිසාවැලපෙමියි දෙව්දුවකීවායමේරන්තෙළඹුවකපාමමමෙහිමහසෑයබඳවමිකැමතිවරයක්ඉල්ලවයිකීයඑසේනම්මහරජතුමනිඒචෛත්‍යයට මාගේනමතබනුමැනවයිඉල්ලාසිටියායඒදුටුගැමුණුරජතුමාඅග්‍රනරදේවයාඅසහායබෞද්ධපාලකයාදෙව්දුවටවූ පොරොන්දුවඉටුකරමින්ස්වර්ණමාලීයනුවෙන්ඒචෛත්‍යයනම්කෙළේයමෙසේයථාවාදීතථාකාරීයම්සේකියයිදඑ සේකරනගුණයෙන්යුතුරජවරුලොවකොහිවෙසෙත්ද

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.
(ii) **ඝෝෂ මහප්‍රාණ** සහිත පද **දෙකක්** ඡේදයෙන් උපුටා දක්වන්න.
(iii) ඡේදයේ ඇති **'සැදි'** යන පදයෙහි ඇතුළත් **පිල්ලම්** නම් කරන්න.
(iv) **රකාරාංශය** හා **ගයනුකිත්ත** යන දෙක ම අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.
(v) ඉහත ඡේදයෙහි සඳහන් වන පදයක් **බැඳි අකුරක්** හා **රේඵයක්** සහිත ව නැවත ලියන්න.


**පිළිතුරු**

අනුරාධපුරයේ (ප්‍රථම රාජධානියේ) මහමෙව්නා උද්‍යානය මධ්‍යයෙහි සිසිල් සෙවණින් සුසැදි, කොළ'තර පක්ෂීන් ගැවසි, අතු පතර විහිදී මනරම් රන්තෙළඹු වෘක්ෂයක් විය. එයට අධිගෘහිත ව ස්වර්ණමාලී නම් දෙව්දුවක් විසුවා ය. ඈ රූමත් ය, සිරිමත් ය, පැහැපත් ය. බු.ව. 382-486 කාලයෙහි රජකළ දුටුගැමුණු රජතුමා, මේ රන්තෙළඹුව (ස්වර්ණමාලියගේ වාසභවනය) කපා එතැන චෛත්‍යයක් ඉදි කිරීමට සිතී ය. එය කැපීමට සැරසෙත් ම "අනේ! මට වුණු විපත, අනේ! මට වුණු විපත" යි කියමින් ඈ හඬා වැලපෙන්නට වූවා ය. රජතුමා එහි ගොස් "ස්වර්ණමාලියෙනි, කුමක් නිසා වැලපෙන්නෙහි ද?" යි විචාළේ ය. "මාගේ වාසභවනය විනාශ කරන නිසා වැලපෙමි." යි දෙව්දුව කීවා ය. "මේ රන්තෙළඹුව කපා, මම මෙහි මහසෑය බඳවමි. කැමති වරයක් ඉල්වව"යි කී ය. "එසේ නම් මහරජතුමනි, ඒ චෛත්‍යයට මාගේ නම තබනු මැනව"යි ඉල්ලා සිටියා ය. ඒ දුටුගැමුණු රජතුමා, අග්‍රනරදේවයා, අසහාය බෞද්ධ පාලකයා දෙව්දුවට වූ පොරොන්දුව ඉටු කරමින් "ස්වර්ණමාලී" යනුවෙන් ඒ චෛත්‍යය නම් කෙළේ ය. මෙසේ යථාවාදී තථාකාරී (යම් සේ කියයි ද එසේ කරන) ගුණයෙන් යුතු රජවරු ලොව කොහි වෙසෙත් ද?


- පද බෙදීමට (ලකුණු 03 යි.)
- **විරාම ලක්ෂණවලට** (ලකුණු 04 යි.)

(ii) රාජධානියේ, මාධ්‍යයෙහි, අධිගෘහිත, වාසභවනය, බෞද්ධ (ලකුණු 02 යි.)
(iii) (කෙටි) ඇදය/(කෙටි) ඇදපිල්ල, ඉස්පිල්ල (ලකුණු 02 යි.)
(iv) ප්‍රෞඪ, සෞරග්‍රහ, සෞත්‍රාන්තික, පෞත්‍ර, මෛත්‍ර (ලකුණු 02 යි.)
(v) ස්වර්ණමාලි (ලකුණු 02 යි.)

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 84%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 1%ක් ද,
ලකුණු 4 - 7 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 8 - 11 ප්‍රාන්තරයේ 54%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 26%ක් වන අතර 20%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




8 වන ප්‍රශ්නයේ අනුකොටස් අතුරෙන් 88% වැඩි ම පහසුතාවක් (iii) අනුකොටසට ලැබී ඇත. අඩු ම පහසුතාවක් පෙන්නුම් කරනුයේ (v) වන අනුකොටසට වන අතර එය 34%කි.


**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

8වන ප්‍රශ්නයේ අනුකොටස් අතුරෙන් (i) අනුකොටස සඳහා පහසුතාව 71%ක් ද, (ii) අනුකොටස සඳහා පහසුතාව 61%ක් ද, (iii) අනුකොටස සඳහා පහසුතාව 88%ක් ද, (iv) අනුකොටස සඳහා පහසුතාව 53%ක් ද, (v) අනුකොටස සඳහා පහසුතාව 34%ක් ද වශයෙන් දැක්විය හැකි ය. මේ අනුව පහසුතා මට්ටමෙහි අනුපිළිවෙළ වන්නේ (iii), (i), (ii), (iv) හා (v) ය. පහසුතා මට්ටමෙහි උසස් මට්ටමක් පෙන්වා ඇත්තේ (iii) අනුකොටස වන අතර පහළ තත්ත්වයක් පෙන්වා ඇත්තේ (v) අනුකොටස ය.


**නිගමන හා යෝජනා**

මෙම ප්‍රශ්නයේ අරමුණ වනුයේ අවිධිමත් ලෙසින් පද යොදා ඇති පාඨයක් විධිමත් ආකාරයෙන් පද බෙදා වෙන් කිරීමත්, විරාම ලක්ෂණ යෙදීමත්, අක්ෂර හා ව්‍යාකරණ පිළිබඳ දැනුම පාඨය ඇසුරෙන් විමසීමත් ය. පහසුතා මට්ටම අතින් පහළ මට්ටමක පැවති (v) වන අනුකොටසට පාදක වූයේ අදාළ ඡේදයේ සඳහන් පදයක් බැඳි අකුරක් හා රේඵයක් සහිත ව නැවත ලිවීම යි. වර්තමානයෙහි බැඳි අකුරු ලිවීමේ ක්‍රමය දක්නට නො ලැබේ. එසේ ම රේඵය භාවිතය ද අඩු ය. මේ අනුව පෙනෙන්නේ කිසියම් යුගයක ලේඛන ව්‍යවහාරයෙහි පැවති අක්ෂර භාවිතය පිළිබඳ අවබෝධය අපේක්ෂකයන් තුළ පහළ මට්ටමක පැවතුණු බවයි. අපේක්ෂකයන්ට වඩාත් පහසු වූ (iii) වන අනුකොටසින් දක්වා තිබුණේ 'සැදි' යන පදයේ පිල්ලම් හඳුන්වා දීම යි. මේ පිල්ලම් බහුල ව භාවිතයෙහි යෙදෙන බැවින් හඳුනා ගැනීමේ දුෂ්කරතා අපේක්ෂකයන්ට නො වීය. දී ඇති පාඨයේ පද විධිමත් පරිදි වෙන්කොට විරාම ලක්ෂණ යොදා නැවත ලිවීම ද අපේක්ෂකයන්ට පහසු වී ඇත. (ii) හා (iv) අනුකොටස්වලට සැපයූ පිළිතුරුවල ද පහසුතා මට්ටම සාමාන්‍ය තත්ත්වයක පැවතිණි.

2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




II ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ඇතුළත් ප්‍රශ්න අතුරෙන් භාෂා අවබෝධය හා විශ්ලේෂණය පිළිබඳ ව 2 ප්‍රශ්නය ද, රචනය හා නිර්මාණකරණ හැකියාව පිළිබඳව 3 වන ප්‍රශ්නය ද දී ඇති අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 72% හා 50% වේ. ඉතිරි ප්‍රශ්න 5 භාෂා විග්‍රහයට ඇතුළත් වන අතර එයින් ප්‍රශ්න 3ක ම පහසුතාව 50%ට වඩා අඩුය.




වර්ගීකරණය අනුව සමස්ත පහසුතාව සැලකීමේ දී භාෂා අවබෝධය හා සංශ්ලේෂණයට 72%ක් වන ඉහළ ම පහසුතාව ද භාෂා විග්‍රහයට 55%ක පහසුතාවක් ද රචනය හා නිර්මාණකරණ හැකියාව ඇසුරෙන් සැකසී ඇති ප්‍රශ්න සඳහා අඩු ම පහසුතාව වන 50%ක් ද හිමි වී ඇත. රචනය හා නිර්මාණකරණ හැකියාව සඳහා ඉහළ පහසුතාවක් අපේක්ෂකයන්ගෙන් අපේක්ෂා කළ යුතු වුවත් රචනා මාතෘකා කෙරෙහි ඔවුන් තුළ ඇති දැනුම, වචන කෝෂය හා ඉදිරිපත් කිරීම මෙන් ම ගලා යාමේ ස්වරූපය ද කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් කියවීමෙන් කරුණු රැස් කර ගත යුතු බවත් අවධාරණයෙන් සඳහන් කළ යුතු ය.

## III කොටස

### 3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා ඃ

3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු**

**පොදු උපදෙස්**

* පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වෙයි. එසේ ම ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇතිව ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* I පත්‍රයේ සහ II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන පිළිතුරක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* II පත්‍රයේ I කොටස ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ඇති වරහන තුළ නිවැරදි වරණයට හිමි අංකය ප්‍රශ්න පත්‍රයේ ම සටහන් කළ යුතු ය.

* ප්‍රශ්න අංක, කොටස් හා අනුකොටස්වල සංකේත නිවැරදිව ලිවිය යුතු ය.

* ප්‍රශ්නයක කිසියම් අනුකොටසකට පිළිතුරු නො සපයන්නේ නම් එම අනුකොටසට හිමි අක්ෂරය හෝ රෝම ඉලක්කම ලියා ඉදිරියෙන් ඉරක් ඇඳිය යුතු ය.

* අනිවාර්ය ප්‍රශ්න හැරුණු විට අනෙකුත් ප්‍රශ්න එක්වරක් කියවා ඔබ පිළිතුරු ලිවීමට අපේක්ෂිත ප්‍රශ්න මොනවා දැ'යි ලකුණු කරන්න.

* ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක අනුපිළිවෙළට නො ව ඔබට ඉතා ම හොඳින් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයකින් පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුගත ව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු අතර අමතර ව තවත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකිය යුතු ය.

* පිළිතුරු පත්‍රයේ සෑම පිටුවක ම විභාග අංකය සටහන් කළ යුතු ය.

* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී කාලය මනාව කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.

* පිළිතුරු සැපයීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.

* කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු ලිවීමත්, දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලිවීමත් නො කළ යුතු ය.

* දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවල දී තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

**විශේෂ උපදෙස්**

* I පත්‍රයේ සාහිත්‍ය විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී උද්ධෘත නිවැරදි ව යෙදීමට සැලකිලිමත් විය යුතු ය.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිසි පරිදි කාලය කළමනාකරණයට හුරු විය යුතු ය.
* පැහැදිලි අත් අකුරු ලිවීමටත්, නිවැරදි ලෙස අකුරු යොදා ගැනීමටත් හුරු විය යුතු ය.
* I පත්‍රයට අදාළ සාහිත්‍ය නිදසුන් දැක්වීමේ දී ප්‍රශ්නයට යෝග්‍ය ආකාරයෙන් නිදසුන් තෝරා ගත යුතු ය. එක සමාන නිදසුන් සෑම ප්‍රශ්නයකට ම යෙදීමට උත්සාහ නො කළ යුතු ය.
* II පත්‍රයේ I සහ II කොටස්වල ඇතුළත් ව්‍යාකරණ අනුකොටස්වලට පිළිතුරු සැපයීමේ දී යෝග්‍ය පිළිතුර ම තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය. මෙහි දී අවබෝධය, දැනුම මෙන් ම තර්කානුකූල චින්තනය ද යොදා ගත හැකි විය යුතු ය.
* තමාගේ හිතුමතය පරිදි යෝග්‍ය යැයි සිතා අංක යෙදීම නො කළ යුතු ය.
* I පත්‍රයේ විචාර ප්‍රශ්නවල දී මෙන් ම II පත්‍රයේ රචනා ප්‍රශ්නයේ දී කරුණු ගැළපීම විධිමත් ව කළ යුතු ය. පිළිතුරෙහි මුල, මැද හා අග අතර විධිමත් ගැළපීමක් පැවතිය යුතු ය.
* ප්‍රශ්නයට අදාළ සියලු කරුණක් ම කිසියම් හේතුවක් නිසා පිළිතුරෙහි ඇතුළත් කිරීමට දුෂ්කරතා ඇතිවන අවස්ථාවල දී ලියා ඇති පිළිතුරු මගින් තමන් තුළ පවත්නා දැනුම අනාවරණය කළ යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

**අයදුම්කරුවන් සඳහා යෝජනා :**

* විෂය නිර්දේශයට අදාළ පොත් පත් අධ්‍යයනය කිරීමේ දී වැදගත් කරුණු මතකයේ තබා ගැනීමත් ග්‍රන්ථ ආශ්‍රිත කරුණු විචාරාත්මක වශයෙන් විමර්ශනය කිරීමත් අවශ්‍ය වේ.

* නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රයෙන් ඇසිය හැකි ප්‍රශ්න ගැන විචාරාත්මක ව සිතා බලා පිළිතුරු සෙවීමට උත්සාහ ගැනීම අවශ්‍ය ය. මෙහි දී පැරණි ප්‍රශ්න පත්‍ර කියවා ඒවායේ අඩංගු කරුණු විශ්ලේෂණය කිරීම වැදගත් ය.

* නිර්දිෂ්ට ග්‍රන්ථ හොඳින් කියවා ඒවායේ චරිත නිරූපණය පරිසර හා අවස්ථා වර්ණනා ගැන මනා අවබෝධයක් ලබා ගැනීම සුදුසු ය.

**ගුරුභවතුන් සඳහා යෝජනා :**

* ප්‍රශ්න පත්‍රවල ආකෘතිය පිළිබඳ ව මනා වැටහීමක් අයදුම්කරුවන් තුළ ඇති කිරීම අවශ්‍ය වේ.

* විෂය නිර්දේශයේ සියලු ම කොටස් පිළිබඳ ව මනා පරිචයක් අයදුම්කරුවන් තුළ ඇති කිරීම සුදුසු ය.

* නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයේ අවශ්‍යතාව අයදුම්කරුවන්ට වටහා දී මනා මග පෙන්වීමත් සිදු කිරීම අවශ්‍ය වේ.

* ප්‍රශ්න පත්‍රවල දී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව හා එම උපදෙස් අභිබවා යෑමෙන් විය හැකි හානි පෙන්වා දීම සුදුසු ය.

* පිළිතුරු ලිවීමේ දී කාලය මනාව කළමනාකරණය කර ගැනීම සඳහා පිළිතුරු ලිවීමේ අභ්‍යාසවල නිරත කරවීම අවශ්‍ය වේ.

* හැකි සෑම විට ම පෙරහුරු පරීක්ෂණවල යොදවමින් විභාගයට මුහුණ දීමේ ශක්තිය අයදුම්කරුවන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ.

* අතිරේක පොත පත කියවීමට සිසුන් ධෛර්යවත් කිරීම සුදුසු ය.

* තර්කානුකූල හා විශ්ලේෂණාත්මක චින්තනයට සිසුන් යොමු කරවීම අවශ්‍ය වේ.

* පොත්පත්වල ඇතුළත් යෝග්‍ය චරිත ශිෂ්‍යයන්ගේ පෞරුෂ වර්ධනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරදීම ද අවශ්‍ය වේ.